## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

## මහා සභා රැස්වීම් වාර්තාව - 2022 මාර්තු

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.03.08 වෙනි දින පෙ.ව: 09.30 ට දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ වූ 2022 මාර්තු මස මහා සභා රැස්වීමේ වාර්තාව.

සහභාගිත්වය:

1. ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා - ගරු සභාපති
2. ආර්.ඒ.විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා - ගරු උප සභාපති
3. ඩබ්.අබේසේන මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
4. ඩී.එස්.එම්.නිමල් මැතිතුමා. - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
5. කේ.ඒ.අයි.ඒ.කන්දෙආරච්චි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
6. යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
7. එම්.ටී.ආර්.ලක්මාල් සමරරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
8. එච්.අමරාවතී මැතිණිය -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
9. ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. කේ.නිශාන් මැතිතුමා. - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
11. පී.ඊ.ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
12. අතුල ජයසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
13. දිස්නා කුමාරි වීරක්කොඩි මැතිණිය -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
14. පී.වී.එන්.සඳමාලි විජේරත්න මැතිණිය -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
15. කේ.විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
16. යශෝධ ලලංග පද්මසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
17. යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
18. ජේ.ඩී.තුෂාර අමරසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
19. යූ.සුධර්මා ලක්මාලි විජේසේකර මැතිණිය -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
20. සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
21. වික්ටර් බණ්ඩාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
22. එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
23. ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
24. පී.කේ.නිමල් රාජපක්ෂ මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
25. එම්.වී.සුගත් මාධව මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
26. ආර්.පී.ශ්‍රියානි ජයකොඩි මැතිණිය -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
27. රනිල් චන්ද්‍ර කුමාර විජේසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
28. එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
29. කේ.ජී.ඒ.කේ.සුමනදාස මැතිණිය -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
30. බී.ඒ.නීතා බාලසූරිය මැතිණිය -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
31. ඩී.ජී.එච්.සී.කේ. පියරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
32. එච්.ඒ.කේ.එන්.ජයවිර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

නොපැමිණි:

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා

02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී කේ.ඩී.එන්.ප්‍රියන්ති මැතිණිය

කාර්යාල නිලධාරීන්:

I ආර්.ඩී.නලින් පුෂ්පකුමාර මහතා - ලේකම්
II. ඩී.එම්.එන්.එන්. දිසානායක මිය - සංවර්ධන නිලධාරී.
III එම්.ජී.ආර්.සී.ජී.විජේරත්න මිය - සංවර්ධන නිලධාරී.

සභාවට පැමිණි සියලු දෙනා ආගම සිහිකිරීම, රණ විරුවන් සිහිකිරීම හා පළාත් පාලන ගීතය ගායනා කිරීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) 2022.02.08 දින පැවැත් වූ මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම:**

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2022 පෙබරවාරි 08 වෙනි දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සියලුම මන්ත්‍රීවරුන් වෙත ලබා දී ඇති බවත් එම වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත්,එසේ නොමැතිනම් එම මහා සභා වාර්තාව සභා සම්මත කරන ලෙසත් දන්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී දිස්නා කුමාරි මැතිණිය:**

2022 පෙබරවාරි 08 වෙනි දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බව ප්‍රකාශ කළාය.

( ගරු මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා සහ ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 09.48)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 පෙබරවාරි 08 වෙනි දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත විය.

( ගරු මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා, ගරු මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා, ගරු මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා, ගරු මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා, ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා, ගරු මන්ත්‍රිනී එම්.බී.ආර්.එන් එල්ලාවල මැතිණිය, ගරු මන්ත්‍රිනී කේ.ජී.කේ.සුමනදාස මැතිණිය, ගරු මන්ත්‍රිනී ශ්‍රියානි ජයකොඩි මැතිණිය, සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 09.50)

**(ආ) ගරු සභාපතිතුමාගේ නිවේදන:**

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අද වන විට රට විශාල ආර්ථික අර්බුදයකට මුහුණ දී තිබෙන බව අප කවුරුත් දන්නා බවත් කොරෝනා වසංගතය හේතුවෙන් මාස කීපයක් වරින් වර රට වසා තැබීමට සිදු වූ බවත් පැවසූ එතුමා ඒ හේතුවෙන් රටේ සියළු ආර්ථික කටයුතු අඩපණ වූ බවත් රටක් ලෙස ඩොලර් සංචිත අඩු වීමේ ගැටළුවක්ද මේ වන විට පවතින බවත් පවසා සිටියේය. රටේ ප්‍රධාන අපනයන කාර්යන් ඇණ හිටීම හේතුවෙන් මේ වන විට ට විශාල අගාධයකට ලක්ව ඇති බවත් පවසා සිටි එතුමා මේ අවස්ථාවේ මේ පවතින තත්වය අවබෝධ කරගෙන කටයුතු කිරීම අපගේ වගකීම බව පවසා සිටියේය. නිදහසින් පසු මේ රට පාලනය

කළ සියළුම දේශපාලන පක්ෂ විසින් වරින් වර ලබා ගත් ණය හේතුවෙන් මේ ආකාරයට රට අවපාතයකට ලක්ව ඇති බැවින් එය නිවැරදි කර ගැනීමට කටයුතු කිරීම අප සියළුදෙනාගේම වගකීම බවත් පවසා සිටියේය.

(සභාව සෝෂාකාරී)

ප්‍රජාතන්ත්‍රවාදී රටක විරෝධතා දැක්වීමේ නිදහස ජනතාවට හිමිව ඇති බවත් එම නිදහස ඒ ආකාරයෙන් මේ සභාව නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරුන්ටද හිමි වුවත් මහා සභාව තුළ විනය පවත්වාගෙන යාමේ වගකීමක් සියළුම සභාකවරුන්ට තිබෙන බව සිහිපත් කර සිටියේය. මේ සභාව නියෝජනය කරනු ලබන්නේ උගත් මන්ත්‍රීවරුකොටසක් බවට තමන් විශ්වාස කරන බවත් ඒ විශ්වසය රැකෙන අයුරින් ඉදිරියේදීත් කටයුතු කරන ලෙස දන්වා සිටියේය.

(ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 09.54)

**(ඇ) ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා නිවේදන සභාවට ඉදිරිපත් කිරීම :**

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

- පවතින විදුලි අර්බුදය හමුවේ පළාත් පාලන ආයතන විසින් වීථි පහන් දැල්වීම 50% කින් අඩු කර විදුලිය ඉතිරි කිරීමට සහය දෙන ලෙස ඉල්ලා යොමු කරන ලද පළාත් පාලන කොමසාරිස්ගේ CLG/DE/03/01 ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව තම වසම් වල සවි කර ඇති වීථි පහන් අනවශ්‍ය වේලාවන් වලදි නිවා දැමීම සඳහා පියවර ගන්නා ලෙස සියළුම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින ලදී.
- නො: 04/260, යටියන්තොට පාර, පහළ තල්දූව අවිස්සාවේල්ල ලිපිනයේ පදිංචි එච්.පී.පී.අයි. ධර්මසේන මහතා විසින් දීර්ග කාලයක් තිස්සේ වරිපනම් වැඩි කිරීම සම්බන්ධයෙන් කරුණු විමසමින් යොමු කරන ලද ලිපිය හා එයට පසුබිම් වූ විස්තරය සඳහන් කර විෂය නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න: -** නැත.

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා:**

**01.(i) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ පොදු කාර්යන් සඳහා වූ වියදම් වෙනුවෙන් ඇමුණුම 01 හි දැක්වෙන 2022.02.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව පිළිගැනීමට හා එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඇමුණුම:01

<u>මුදල් හා ප්‍රතිපත්ති කමිටු කාරක සභා වාර්තාව</u>

දිනය:-2022.02.22 වේලාව :- පෙ:ව:09.00

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා පහත නම් සඳහන් අනෙකුත් සමාජික ගරු මන්ත්‍රී තුමන්ලාගේ සහභාගිත්වයෙන් පැවැති මුදල් හා ප්‍රතිපත්ති කමිටු කාරක සභාවේ වාර්තාවයි.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා | ගරු සභාපති |
| 02 | විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා | ගරු උප සභාපති |
| 03 | ඩබ්.අබේසේන මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 04 | සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 05 | ලක්මාල් සමරරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 06 | විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 07 | එම්.එම්.ෆර්හාන් මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 08 | සුධර්මා ලක්මාලි මැතිණිය | ගරු මන්ත්‍රී |

**මුදල් හා ප්‍රතිපත්ති කමිටු කාරක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් වූ බිල්පත්:-**

| අනු අංකය | විස්තරය | මුදල | බිල්පත් අංකය දිනය | ආයතනය |
|---|---|---|---|---|
| 01 | කෑගල්ල පළාත්බද මහාධිකරණයේ නඩු අංක 6210/රිට් නඩුවේ නීතීඥවරයා ලෙස පෙනී සිටින ටයිටස් මනතුංග මහතා වෙත අත්තිකාරම් මුදල් ගෙවීම | රු. 50,000.00 | | නීතීඥ ටයිටස් මනතුංග මහතා , |

**කාරක සභාව වෙත ඉදිරිපත් වූ යෝජනා :**

I. දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලය හා නව පොදු වෙළඳ සංකීර්ණය පිරිසිදු කිරීමේ කටයුතු සතියට දින 06ක් සිදු කරන අතර ඉරිදා දිනයේදී එම කටයුතු සිදු නොකරයි. ඉරිදා දිනයේත් එම පිරිසිදු කිරීමේ කටයුතු සිදු කිරිමට අපහසු බැවින් ක්‍රීඩා පිටියේ හෝ ශ්‍රවණාගාරයේ උත්සවයක් පැවතුනහොත් එවැනි අවස්ථාවලදී ඉරිදා දිනයේ පැමිණ අදාල පිරිසිදු කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා තමන් සූදානම් බැවින් එවැනි විශේෂිත උත්සවයක් නොමැති අවස්ථා වලදී ඉරිදා දිනය නිවාඩුවක් ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා අදාල පිරිසිදු කිරීම් කටයුතු සිදු කරනු ලබන එම්. කරුණාරත්න මහතා විසින් යොමු කරන ලද ලිපිය කාරක සභාව වෙත ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

සතියේ දින 06 ක් පිරිසිදු කිරීම් කටයුතු සිදු කරනු ලබන බැවින් සහ විශේෂ උත්සව අවස්ථා වලදී ඉරිදා දිනයේත් රාජකාරි කටයුතු සිදු කිරීමට එකඟතාවය ප්‍රකාශ කර ඇති බැවින් විශේෂිත උත්සවයක් නොමැති අවස්ථා වලදී ඉරිදා දිනය නිවාඩුවක් ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බව කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.

II. දෙහිඕවිට පොලිස් ස්ථානය සඳහා ඉඩම් කොටසක් පවරා ගැනීම සම්බන්ධව සීතාවකපුර කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විසින් යොමු කරන ලද SW/SA/111/ඉඩම/04/2021 හා 2022.01.12 දිනැති ලිපිය මඟින් සභාවට අයත් දැරණියගල පාරේ පිහිටි පැරණි සභා ගොඩනැඟිල්ල සහිත භූමිය ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරා දෙන ලෙස ඉල්ලා ඇති අතර එම ලිපිය කාරක සභාවේ නිරිදේශ ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

මහා සභා තීරණයක් ලබාගෙන අදාල ඉඩම පවරා දීම සුදුසු බව තීරණය කරන ලදී.

III. සපුමල්කන්ද මිණිමුතු ක්‍රීඩා සමාජය සඳහා ක්‍රීඩා පිටියක් නොමැති බැවින් එම ප්‍රදේශයෙන් ඉඩමක් සභාව වෙත පවරා ගෙන අදාල ක්‍රීඩා සමාජය මඟින් එහි නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා සුදුසු ඉඩමක් ලබා දෙන ලෙස ඉල්ලා යොමු කරන ලද ලිපියට අනුව බොගවන්තලාව වතු සමාගමෙන් අදාල කාර්ය සඳහා ඉඩමක් ලබා දෙන ලෙස ඉල්ලා සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර්වතු ආශ්‍රිත බෝග වගා සහ කර්මාන්ත ශාලා නවීකරණය හා තේ රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් යොමු කරන ලද ලිපියේ පිටපතක් මෙම සභාව වෙත යොමු කර තිබූ අතර එය කාරක සභාවේ අවධානය සඳහා ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

මෙම කාර්ය සඳහා අවශ්‍ය වාර්තා ලබා දීම සභාවේ මැදිහත් වීමෙන් සිදු කිරීම සඳහා කාරක සභා අනුමැතිය ලබා දෙන ලදි.

**iv**. දෙහිඕවිට වෙලන්ගල්ල වසමේ ඇති සභාව සතු ළිං අතුරින් දිමියන්ගහ වත්ත ඉඩම තුළ ඇති පානීය ජලය සඳහා සුදුසු ළිඳ මේ වන විට පිරිසිදු කර ඇති බැවින් එය පිළිසකර කර මේ නියඟ කාලයේදී ජනතාවගේ පානීය ජල ගැටළුවට විසඳුමක් ලබා දිය හැකි බැවින් එම ළිඳේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලෙස ඉල්ලා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී රසිකා එල්ලාවල මැතිණිය විසින් යොමු කරන ලද ලිපිය කාරක සභාවේ නිර්දේශ සඳහා ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

කාර්මික නිලධාරී වාර්තාවක් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට කාරක සභාව විසින් තිරණය කරන ලදී.

**v.** ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කසළ එක් රැස් කිරීමේ කාර්ය සඳහා දැනට සේවයේ නියුතු කම්කරුවන් ප්‍රමාණවත් නොවන බවත් සේවයේ යෙදී සිටින සෞඛ්‍ය කම්කරුවන්ද වරින් වර සේවයෙන් ඉවත් වීම මත කසළ එක් රැස් කිරීමේ කටයුතු පවත්වාගෙන යාම ගැටළුසහගත වී ඇති බවත් එම නිසා මෙම සභාවේ සෞඛ්‍ය කම්කරු ස්ථිර තනතුරේ සේවය කර වයස අවුරුදු 60 ක් සම්පූර්ණ වීම මත 2019.03.10 දින සිට විශ්‍රාම ගන්වා ඇති සෞඛ්‍ය කම්කරු එම් .ඒ. සේනාරත්න මහතා සිය රාජකාරි කාලය තුළ ඔහුට පවරා ඇති රාජකාරි කාර්යක්ෂමව ඉටු කරන බැවින් ඔහුගේ සේවය තව දුරටත් සභාවට අවශ්‍ය වී ඇති බැවින් සේවයෙන් විශ්‍රාම ගෙන සිටින ඔහු තවදුරටත් සේවයේ යොදවා ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් ඉල්ලා විෂය නිලධාරිනිය විසින් කාරක සභාව වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

ඉහත කී සේවක මහතා රාජකාරි කාලයේදීත් අළුයම සේවයට වාර්තා කර පෙරවරු 06.00 වන විට නගරය පිරිසිදු කිරීම් සිදු කර අවසන් කරන බවත් ඔහුට පවරා ඇති රාජකාරි කාර්යක්ෂමව ඉටු කරන බැවින් මහා සභා තීරණයක් ලබා ගෙන කොන්ත්‍රාත් පදනම මත ඔහු නැවත සේවයට බඳවා ගැනීම සුදුසු බවට කාරක සභාව නිර්දේශ කරන ලදී.

**vi**. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 අනුව රජයේ නිලධරයන්ට හා විශ්‍රාමිකයන්ට රු.5000.00 ක මාසික දීමනාව ලබා දීම යටතේ දෛනික වැටුප් ලබන නිලධරයන් සඳහාද එම දීමනාව ලබා දීම සඳහා හිමිකම් ඇති බව සඳහන් කර ඇත. මෙම සභාවේ දෛනික සේවයේ යෙදී සිටින කම්කරුවන් ගණන 28කි. ඒ අනුව එම සේවකයන් සඳහා රු.5000.00 ක මුදල ලබා දුනහොත් රුපියල් වර්ෂයක් සඳහා රුපියල් විසිලක්ෂ හැත්තෑහයදහසක මුදලක් සභා අරමුදලින් දැරීමට සිදු වන බවත් 2022 අයවැය ඇස්තමේන්තුගත කිරිමේදී ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර නොමැති බැවින් දෛනික වැටුප් ලබන නිලධරයන් සඳහා මෙම දීමනාව ලබා දීමට අවශ්‍ය උපදෙස් ඉල්ලා විෂය නිලධාරිනිය විසින් කාරක සභාව වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

සේවා කාලය වසර 05 ට වැඩි දෛනික වැටුප් ලබන සේවකයන් 05 දෙනෙකු සිටින බැවින් ඔවුන් සඳහා රු.5000.00 බැගින්ද සේවා කාලය වසර 05 ට අඩු ඉතිරි 23 දෙනා සඳහා රු.3000.00 බැගින්ද මාසිකව ගෙවීම සඳහා මහා සභා අනුමැතියක් ලබා ගෙන එකී කාර්ය සිදු කිරීම සුදුසු බවට නිර්දේශ කරන ලදී.

**vii.** කුවේට් ආධාර යටතේ නැවත ඉදි වන ප්‍රධාන පාලම් 25 ව්‍යාපෘතියට අදාලව දෙහිඕවිට ප්‍රාදේශීය සභාව වෙත අලුත්වැඩියා කර ලබා දී ඇති පාලම් ත්‍රිත්වය සඳහා වන විදුලි බිල්පත් ගෙවීම සඳහා ලං.වි.ම. විසින් එම බිල්පත් කාර්යාලයට යොමු කර ඇති බවත් මෙම පාලම් ත්‍රිත්වය සඳහා වන විදුලි බිල්පත් සභා අරමුදලින් දැරීමට සිදු වුවහොත් මාසිකව රු.11,400.00 කට ආසන්න මුදලක් වැය වන බවත් වාර්ෂිකව එම මුදල රු. 136,800.00ක් පමණ වන බවත් 2022 අයවැය මඟින් මේ සඳහා ප්‍රතිපාදන වෙන් කර නොමැති බැවින් කාරක සභාවේ උපදෙස් ඉල්ලා විෂය නිලධාරිනිය විසින් කාරක සභාව වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතනයක් බැවින් වාර්ෂිකව දැරීමට වන මුදල අනුව එවැනි මුදලක් ගෙවීමට අපහසු බව දන්වා අදාල ආයතනයට ලිපියක් යැවීමට නිර්දේශ කරන ලදී. (එම ලිපියේ මෙවැනි ව්‍යාපෘති සඳහා සූර්ය කෝෂ මඟින් විදුලිය ලබා ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස යෝජනා කරන ලෙසත් දන්වා සිටීම සුදුසු බව නිර්දේශ කරන ලදි.)

**viii.** 2022 වර්ෂයය සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය සභාව මඟින් යන්ත්‍ර සූත්‍ර කුලියට ලබා දීම සඳහා වන ගාස්තු 2021/10/22 දින අංක 2251 දරණ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලදී. එසේ වුවත් ඉන් පසු අවස්ථා කීපයකදී සිදු කරන ලද ඉන්ධන ගාස්තු සහ ගෑස් මිල වැඩි කිරීම හේතුවෙන් ආදාහනාගාර ගාස්තු සහ යන්ත්‍ර සූත්‍ර කුළියට ලබා දීමේ ගාස්තු පවතින මිල ගණන් යටතේ පවත්වාගෙන යාම දුෂ්කර වී ඇති බැවින් එම ගාස්තු සංශෝධනය කිරීම සඳහා විෂය නිලධාරී විසින් කාරක සභාවේ අනුමැතිය ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

මහා සභා අනුමැතියක් ලබා ගෙන පහත පරිදි අදාල ගාස්තු සංශෝධනය කිරීම සඳහා කාරක සභා අනුමැතිය ලබා දෙන ලදී.

- ආදාහනාගාර ගාස්තු බල ප්‍රදේශය තුළ පදිංචිකරුවෙකුගේ මෘත දේහයක් ආදාහනය සඳහා පැවති රු. 6,500.00 ක මුදල රු. 7500.00 දක්වා සංශෝධනය කිරීමටත් බල ප්‍රදේශයෙන් පිටත මෘත දේහයක් ආදාහනය සඳහා පැවති රු. 7,500.00 ක මුදල රු. 8500.00 දක්වා සංශෝධනය කිරීමට නිර්දේශ කරන ලදී.

- යන්ත්‍ර සූත්‍ර කුලියට ලබා දීමේදී ටිපර් කියුබ් 2 ½ රු.14000.00 ( කි.මී. 100 ට වැඩි කිලෝමීටරයකටම ඉන්ධන සහිතව රු.80.00)

- ට්‍රැක්ටරය (ඝන අඩි 75 ටේලරය සමඟ) රු. 6300.00 (වැඩ කරන පැය 08ක් ඉන්ධන සහිතව)

- ගල් රෝල ( පැය 4 ට අඩු අවම ගාස්තුව රු.12,000.00 (පැය 04 ඉක්මවන සෑම පැයකටම රු. 2,360.00)

- බැකෝ ලෝඩරය රු.3000.00 (පැයකට ඉන්ධන සහිතව)

- ජල බවුසරය (ලීටර් 3000 ) - රු. 3,000.00 (මීටර් පැයකට අතිරේක ගාස්තුව ඉන්ධන සහිතව රු. 400.00)

- ගලි බවුසරය රු.7,000.00 (ගාස්තු රු.5000.00 + බැහැර කිරීම සඳහා රු.2000.00) ( මීටර් පැයකට අතිරේක ගාස්තුව රු.400.00)

- තණ කොළ කපන මැෂිම රු. 500.00 (ඉන්ධන රහිතව)

**ix.** ශ්‍රී ලංකා සුනිත්‍ය බල ශක්ති අධිකාරිය මඟින් පවතින විදුලි අර්බුදය හමුවේ වීථි ලාම්පු වල ක්‍රියාකාරිත්වය කාර්යක්ෂම සහ බල ශක්ති සංරක්ෂණය වන ආකාරයට සිදු කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දී එවන ලද ලිපිය කාරක සභාව වෙත යොමු කර තිබුණි.

**තීරණය:**

පවතින විදුලි අර්බුදය හමුවේ අනවශ්‍ය ලෙස විදුලිය භාවිතා නොකිරීම පුරවැසියන් වශයෙන් අපගේ වගකීම වන බැවින් වීථි ලාම්පු නියමිත වේලාවට දැල්වීම සහ නිවා දැමීම පිළිබඳව අවධානය යොමු කිරීම, වීථි ලාම්පු සඳහා එල්.ඊ.ඩී. විදුලි පහන් සවි කිරීම, අත්‍යාවශ්‍ය නොවන වීථි පහන් හඳුනාගෙන ඒවා දැල්වීමෙන් වැලකීම, වැනි ශ්‍රී ලංකා සුනිත්‍ය බල ශක්ති අධිකාරිය මඟින් යොමු කරන ලද ලිපියේ සඳහන් උපදෙස් පළාත් පාලන ආයතනය ලෙස අනුගමනය කිරීම සුදුසු බව කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.

**xi.** සභාවට අයත් RE2558 අංක දරණ ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම සඳහා විමල් ඇග්‍රෝ ආයතනය විසිනි ඉදිරිපත් කර ඇති රු.100910.00ක වියදම් ඇස්තමේන්තුව මුදල් කාරක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

අදාල ඇස්මේන්තුව පිළි ගැනීමටත් අලුත් වැඩියා කටයුතු සිදු කිරීම සඳහාත් කාරක සභා අනුමැතිය ලබා දෙන ලදී.

**xii.** සභාවට අයත් බොබ් කැට් යන්ත්‍රය සඳහා ගල් ටයර් 04 ක් ලබා ගැනීම සඳහා ඩීමෝ ආයතනය විසින් ඉදිරිපත් කරන ලද වියදම් ඇස්තමේන්තුව මුදල් කාරක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා බොබ් කැට් යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය අත්‍යාවශ්‍ය බැවින් අදාල ටයර මිලදී ගැනීම සඳහා කාරක සභා අනුමැතිය ලබා දෙන ලදී.

**xiii.** ව්‍යාපෘති සඳහා ගොඩනැඟිලි ද්‍රව්‍ය හා අනෙකුත් අමු ද්‍රව්‍ය සැපයීමේදී ශ්‍රීලංකා ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවෙන් ලබා ගැනීම හැකි බවට සඳහන් කරමින් කැගල්ල සහකාර පළාත් පාලන කොමසාරිස් විසින් යොමු කර තිබූ ලිපිය නිර්දේශ ලබා ගැනීම සඳහා කාරක සභාව වෙත ඉදිරිපත් කර තිබුණි

**තීරණය:**

සභාවේ අවශ්‍යතාව අනුව මිලදී ගැනීමට කාරක සභා නිර්දේශය ලබා දෙන ලදී.

**xiv.** දීගල වත්ත ජල ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ඒ සඳහා අවශ්‍ය ළිඳ සහ මෝටර් කාමරය සැදීම සඳහා තම ඉඩමෙන් ස්ව කැමැත්තෙන් කොටසක් ලබා දුන් බවත් එම ඉදි කිරීම් සිදු කිරීමේදී තම ඉඩමේ ආදායම් ලබමින් තිබූ රබර් ගස් 10 කට පූර්ණ වශයෙන් හානි සිදු වී තේ ගස් 50 ක් පමණ විනාශ වීම හේතුවෙන් ඒවායින් ලැබූ ආදායම තමන්ට අහිමි වූ බැවින් ඊට විකල්පයක් වශයෙන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන භූමියේ ඇති තේ හා රබර් වගාවේ අස්වනු වසර දෙකක් තමන්ට භුක්ති විඳීමට ලබා දෙන ලෙස ඉල්ලා 175/5 දීගල වත්ත, හිඟුරලකන්ද , දෙහිඕවිට ලිපිනයේ පදිංචි ටී.ජී.කෞශල්‍යා ප්‍රියන්ති මහත්මිය විසින් යොමු කරන ලද ලිපිය කාරක සභාවේ නිර්දේශ සඳහා ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

එම ස්ථානයට මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ ගරු මන්ත්‍රීවරුන් ගොස් ස්ථාන පරීක්ෂාවක් සිදු කිරීමෙන් අනතුරුව නිර්දේශයක් ලබා දීම සුදුසු බව නිර්දේශ කරන ලදී.

**xv.** සභාවට අයත් පූර්ව මිශ්‍රණ අංගනයේ සකස් කරන පූර්ව මිශ්‍රණ ප්‍රවාහනය සඳහා ට්‍රැක්ටර් ටේලරයක් අවශ්‍ය බවට කාර්මික නිලධාරී විසින් ඉල්ලීමක් කර ඇති අතර එම ඉල්ලීම කාරක සභාවේ නිර්දේශ සඳහා යොමු කර තිබුණි.

**තීරණය:**

මේ අවස්ථාවේ අලුතින් මිලදී ගැනීම් සඳහා යොමු වීම සංකීර්ණ ක්‍රියාවලියක් බැවින් වෙනත් ආයතනයක් සමඟ සභාවේ භාවිතයට නොගන්නා වෙනත් රථයක් සමඟ හුවමාරු කර ට්‍රැක්ටර් ටේලරයක් ලබා ගැනීම සම්බන්ධයෙන් සොයා බැලීම සුදුසු බව නිර්දේශ කරන ලදී.

**xvi.** දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින දරිද්‍රතාවය සහ ළමා හා කාන්තා හිංසනය පිටු දැකීමේ අරමුණු ඇතිව බල ප්‍රදේශයේ වසම් 39 හි කාබනික පොහොර ගෙවතු වගා ව්‍යාපෘතියක් සිදු කිරීමට අදාලව සකස් කරන ලද ව්‍යාපෘති වාර්තාව කාරක සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

අදාල ව්‍යාපෘති වාර්තාව සඳහා කාරක සභා අනුමැතිය ලබා දෙන ලදී.

**කාරක සභාව මඟින් ඉදිරිපත් වූ යෝජනා:**

- දෙහිඕවිට දැරණියගල මාර්ගයට පිවිසීම සඳහා ඇති දෙහිඕවිට එළු කුකුළු මස් කඩය අසලින් ඇති අතුරු මාර්ගය වාහන ධාවනයට නොහැකි ලෙස අබලන් වී ඇති නිසා අධික වාහන තදබදයක් සහිත අවස්ථා දැරණියගල මාර්ගයට පිවිසෙන වලදී අතුරු මාර්ගක් ලෙස මේ මාර්ගය භාවිතා වන බැවින් එයට ප්‍රිමික්ස් යොදා සකස් කිරීමට කටයුතු කිරීම සුදුසු බවට නිර්දේශ කරන ලද

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(ii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ පොදු කාර්යන් සඳහා වූ වියදම් වෙනුවෙන් ඇමුණුම 02 හි දැක්වෙන 2022 පෙබරවාරි මාසයේ මාසික වියදම් සඳහා ගෙවීම් අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඇමුණුම අංක 02

**දෙහිඕවිට ප්‍රාදේශීය සභාව**

**2022 පෙබරවාරි මස 28 වන දින තෙක් ගෙවීම් වවුචර්පත්**

| දිනය | වවුචර්පත් අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|
| පෙබ:02 | 182 | දාස මෝටර්ස්<br>LL6937 ටිපර් රථය හා LL7582 කැබ් රථයේ ඉදිරිපස බෆර් එක අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 18,000.00 |
| පෙබ:02 | 183 | එල්.ඒ.එල්.එල්.පී.බණ්ඩාර<br>ශ්‍රම අභිමන් උපහාර උළෙලේ කෝප්ප,කුඩ හා රැපින් පේපර් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,770.00 |
| පෙබ:02 | 184 | නීතිඥ ටයිටස් මනතුංග<br>කෑගල්ල පළාත්බද මහාධිකරණ නඩු අංක 6210/රිට් නඩුව සඳහා අත්තිකාරම් මුදල් ගෙවීම. | 50,000.00 |
| පෙබ:02 | 185 | මු.භා.ක-ආර්.ජී.එස්.ඩී.රොෂාන්ත<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 8,437.00 |
| පෙබ:02 | 186 | මු.භා.ක-එස්.පී.තිලකරත්න<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 8,521.00 |
| පෙබ:02 | 187 | මු.භා.ක-එච්.ජී.දේශප්‍රිය<br>2022 ජනවාරි මස අතිකාල ගෙවීම. | 11,420.00 |
| පෙබ:02 | 188 | මු.භා.ක-එච්.පී.පී.සමන්කුමාර<br>2022 ජනවාරි මස අතිකාල ගෙවීම. | 11,983.00 |
| පෙබ:02 | 189 | මු.භා.ක-කේ.එම්.ඒ.ජේ.එන්.සිරිසේන<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 3,796.00 |

| | | | |
|---|---|---|---|
| පෙබ:02 | 190 | මු.හා.ක-ආර්.ඩී.සී.කරුණාරත්න<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 1,912.00 |
| පෙබ:02 | 191 | මු.හා.ක-එච්.පී.පී.සමන්කුමාර<br>ගමන් වියදම් ගෙවීම. | 4,200.00 |
| පෙබ:02 | 192 | මු.හා.ක-ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද<br>ගමන් වියදම් ගෙවීම. | 10,500.00 |
| පෙබ:03 | 193 | මු.හා.ක-කේ.ඩී.නයනා ප්‍රියන්ති<br>2021 දෙසැම්බර් මස දෙ/ප්‍රා/සභාවේ (සභික) ඉන්ධන හා දුරකතන දීමනා ගෙවීම. | 8,000.00 |
| පෙබ:03 | 194 | මු.හා.ක-එම්.ආර්.පී.කුමාරසිරි<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 8,583.00 |
| පෙබ:03 | 195 | මු.හා.ක-ඩී.එල්.ආර්.සිසිරකුමාර<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 4,550.00 |
| පෙබ:03 | 196 | මු.හා.ක-යූ.එල්.ජී.ජයතිලක<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 6,779.00 |
| පෙබ:03 | 197 | මු.හා.ක-එච්.ආර්.කේ.ජයවර්ධන<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 8,166.00 |
| පෙබ:03 | 198 | මු.හා.ක-ටී.කේ.අයි.ප්‍රේමරත්න<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 6,310.00 |
| පෙබ:03 | 199 | මු.හා.ක-ඩබ්.ඒ.දර්ශන කොඩිකාර<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 9,045.00 |
| පෙබ:03 | 200 | මු.හා.ක-එච්.එම්.එස්.නන්දකුමාර<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 4,523.00 |
| පෙබ:03 | 201 | මු.හා.ක-බී.පී.එන්.විජේතුංග<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 3,419.00 |
| පෙබ:03 | 202 | මු.හා.ක-බී.එස්.එස්.කුමාරි<br>2022 ජනවාරි මස අතිකාල ගෙවීම. | 3,669.00 |
| පෙබ:07 | 203 | ගගන හාඩ්වෙයාර්<br>දොර ලොක් 2ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,150.00 |
| පෙබ:07 | 204 | දිලාන් ජයසිංහ ප්‍රවාහන සේවය<br>අත්දිග ග්ලවුස් හා අත්කොට ග්ලවුස් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 9,225.00 |
| පෙබ:07 | 205 | ආසිරි එන්ටප්‍රයිසස්<br>RD8018 ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම සඳහා ලබාගත් ද්‍රව්‍ය හා කාර්මික උපකරණ වෙනුවෙන් මුදල් ගෙවීම. | 46,700.00 |
| පෙබ:08 | 206 | මු.හා.ක-ඒ.එම්.කේ.කේ.අත්තනායක<br>ගමන් වියදම් ගෙවීම. | 1,570.00 |
| පෙබ:08 | 207 | මු.හා.ක-අයි.ටී.විජේතුංග<br>සර්ජිකල් ග්ලවුස් 6 ක් ලබා ගැනීම වෙනුවෙන් අතින් දැරූ මුදල් ලබා ගැනීම. | 150.00 |
| පෙබ:08 | 208 | මු.හා.ක-ආර්.ඩී.සී.කරුණාරත්න<br>ප්‍රා.සභා.කාර්යාල සංකීර්ණයේ මහජන වැසිකිළියේ ජල කරාම අලුත්වැඩියා කිරීම සඳහා ලබාගත් අමතර උපාංග වෙනුවෙන් අතින් දැරූ මුදල් ලබා ගැනීම. | 500.00 |

| | | | |
|---|---|---|---|
| පෙබ:08 | 209 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>2022/02/09 දින පැවැත්වීමට නියමිත තත්ව පාලන කව පුහුණු වැඩසටහන සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 20,000.00 |
| පෙබ:08 | 210 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 පෙබරවාරි මස දෙ/ප්‍රා/සභාවේ සභික දීමනා ගෙවීම. | 795,000.00 |
| පෙබ:08 | 211 | එන්.කරුණාරත්න<br>දෙ/ප්‍රා/සභා කාර්යාල පරිශ්‍රය හා පොදු වෙළඳ සංකීර්ණය පිරිසිදු කිරීම සඳහා 2022 ජනවාරි මස මුදල ගෙවීම. | 85,200.00 |
| පෙබ:08 | 212 | මු.හා.ක-එම්.එල්.අරුණකුමාර<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 1,540.00 |
| පෙබ:08 | 213 | මු.හා.ක-එම්.එල්.අරුණකුමාර<br>2021 නොවැම්බර් මස අතිකාල ගෙවීම. | 2,020.00 |
| පෙබ:08 | 214 | මු.හා.ක-එම්.එල්.අරුණකුමාර<br>2021 අගෝස්තු මස අතිකාල ගෙවීම. | 2,020.00 |
| පෙබ:08 | 215 | කේ.එම්.එස්.ඔටෝ කෙයාර්<br>PF7369 කැබ් රථය සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම.(2021 දෙසැම්බර්) | 21,643.00 |
| පෙබ:08 | 216 | එච්.වී.කේ.ඩී.ආර්.හිත්තැටිය<br>ශ්‍රම අභිමන් උපහාර උළෙල සඳහා වතුර බෝතල් හා හකුරු ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,825.00 |
| පෙබ:08 | 217 | දේශීය ණය සහ සංවර්ධන අරමුදල<br>තල්දූව පොදු වෙළඳ සංකීරණය ඉදිකිරීමට දේශිය ණය සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ණය මුදලේ මුදල හා පොළී මුදල ගෙවීම.(2022 ජනවාරි සඳහා) | 156,136.31 |
| පෙබ:08 | 218 | රෙජිස්ට්‍රාර් ජනරාල්<br>2020 ඔක්තොම්බර් මසට අදාල මුද්දර ගාස්තු උපලේඛන සැකසීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 10,200.00 |
| පෙබ:08 | 219 | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්<br>2021 වර්ෂයේ ඔක්තොම්බර්,නොවැම්බර් හා දෙසැම්බර් යන මාස සඳහා විශ්රාම වැටුප් දායක බිල්පත් ගෙවීම. | 10,334.79 |
| පෙබ:08 | 220 | එස්.ඒ.එස්.ටී.පෙරේරා<br>ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණයේ ළමුන් සඳහා ලබාගත් ටී බනිස් වෙනුවෙන් මුදල් ගෙවීම. | 15,000.00 |
| පෙබ:08 | 221 | පී.ඒ.ගුණරත්න<br>කතෘ ප්‍රකාශන මිලදී ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,725.00 |
| පෙබ:08 | 222 | කැගල්ල ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>ඊ/ආදාහනාගාරයට ගෑස් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 42,080.00 |
| පෙබ:08 | 223 | ඒ.එස්.එස්.අබේසිරිවර්ධන<br>දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ බේල් යන්ත්‍රයේ අලුත්වැඩියා කටයුතු හා සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 24,210.00 |
| පෙබ:09 | 224 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 ජනවාරි මස දෙ/ප්‍රා/සභාවේ කුලී පදනම මත වැටුප් ගෙවීම. | 890,607.69 |

| | | | |
|---|---|---|---|
| පෙබ:11 | 225 | සී.එම්.පී.රුවන්කුමාර<br>A3 ඡායා පිටපත් බණ්ඩල් 02ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,400.00 |
| පෙබ:11 | 226 | වැනට් ලංකා කොම්පියුටර්ස්<br>78A ටෝනර් 01 ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,700.00 |
| පෙබ:11 | 227 | කේ.කේ.ඒ.ආර්.කුමාරසිංහ<br>42-7498 අංක දරණ ගිලන් රථයට ස්පීඩ් මීටර් වීල් එකක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,750.00 |
| පෙබ:11 | 228 | පී.ආර්.ඒ.පී.පී.කුලරත්න<br>ජලය ලබා ගැනීම සඳහා මාර්ගය පලුදු කිරීම වෙනුවෙන් තැන්පත් කල මුදල් ලබා ගැනීම. | 5,833.00 |
| පෙබ:11 | 229 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>2022 ජනවාරි මස ගමන් වියදම් ගෙවීම. | 6,000.00 |
| පෙබ:11 | 230 | මු.හා.ක-ආර්.එම්.එච්.රත්නායක<br>2022.01.27 දින මානියම්ගම පැවැත්වූ ජංගම ආයුර්වේද සායනයේ සංග්‍රහ වියදම් ගෙවීම. | 2,050.00 |
| පෙබ:11 | 231 | මු.හා.ක-ආර්.ඩී.නලින් පුෂ්පකුමාර<br>දෙ/ප්‍රා/සභාවේ ලේකම් ධුරයේ වැඩ බැලීමට අදාල දීමනාව ගෙවීම.(2022.01.11-2022.02.10 දක්වා) | 10,583.75 |
| පෙබ:11 | 232 | මු.හා.ක-කේ.ජී.පී.එල්.සෝමවීර<br>ගමන් වියදම් ගෙවීම. | 450.00 |
| පෙබ:11 | 233 | මු.හා.ක-කේ.ජී.පී.එල්.සෝමවීර<br>ගමන් වියදම් ගෙවීම. | 420.00 |
| පෙබ:11 | 234 | මු.හා.ක-එස්.එන්.ඩී.එම්.කුමාරි<br>ගමන් වියදම් ගෙවීම. | 420.00 |
| පෙබ:11 | 235 | මු.හා.ක-කේ.එම්.ටී.එම්.කපුකොටුව<br>ගමන් වියදම් ගෙවීම. | 450.00 |
| පෙබ:11 | 236 | මු.හා.ක-ඩී.එම්.එන්.එන්.දිසානායක<br>2022.01.11 දින පැවති මහා සභාවේ සංග්‍රහ වියදම් ගෙවීම. | 4,985.00 |
| පෙබ:14 | 237 | ආර්.යූ.දසනායක<br>250-4053 කැබ් රථයේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් මුදල් ගෙවීම. | 20,200.00 |
| පෙබ:14 | 238 | ජයසිංහ රබර් ස්ටෝර්ස්<br>ඊරියගොල්ල ආදාහනාගාරයට ගෑස් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 25,950.00 |
| පෙබ:14 | 239 | සම්බෝධි වැඩිහිටි සංවිධානය-කනංගම<br>කනංගම කුරුඳුවත්ත අතුරු මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% මුදල් ගෙවීම. | 10,000.00 |
| පෙබ:14 | 240 | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිය-කෑගල්ල<br>දිගල ග්‍රාමයෙහි පිහිටි පොදු සුසාන භූමිය සභාව වෙත පවරා ගැනීම සඳහා අදාල මිනුම් කටයුතු සිදුකිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | 15,872.69 |
| පෙබ:14 | 241 | ප්‍රේමරත්න ස්ටෝර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර්<br>කසල බේල් කිරීමේ මැෂිමක්,පටි හා ක්ලිප් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 12,590.00 |

| | | | |
|---|---|---|---|
| පෙබ:14 | 242 | කේ.එම්.එස්.ඔටෝ කෙයාර්<br>PF7369 කැබ් රථය සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම.(2022 පෙබරවාරි) | 25,140.00 |
| පෙබ:14 | 243 | ඩබ්.එන්.කේ.වඩුගේ(නිම්න හාඩ්වෙයාර්)<br>පූර්ව මිශ්‍රණ අංගනයට ලබාගත් සිමෙන්ති කොට්ට 30ක් වෙනුවෙන් මුදල් ගෙවීම. | 47,250.00 |
| පෙබ:14 | 244 | සකුරා හාඩ්වෙයාර්<br>මාගම්මන ආයුර්වේදයේ වහලයේ අලුත්වැඩියා කටයුතු සඳහා ලබාගත් ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,680.00 |
| පෙබ:14 | 245 | සකුරා හාඩ්වෙයාර්<br>ඊරියගොල්ල හෙළබොජුන්හලෙහි ජලනල පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා ලබාගත් ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,085.00 |
| පෙබ:14 | 246 | එච්.වී.කේ.ඩී.ආර්.හිත්තැටිය<br>500ml ප්‍රමාණයේ වතුර බෝතල් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,750.00 |
| පෙබ:14 | 247 | ජී.ජී.යසස් සුධාරක උපසේන<br>250-4053 කැබ් රථයේ ස්ටාට් ස්විචය රෙපයාර් කිරීම හා මෝටරය ගලවා සවිකිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 5,500.00 |
| පෙබ:14 | 248 | දිනේෂ් ඔටෝ ඉලෙක්ට්‍රිකල්ස්<br>බොබ් කැට් යන්ත්‍රයේ A/C ගෑස් පිරවීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,100.00 |
| පෙබ:14 | 249 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ඵලදායිතා තත්වකව පුහුණු වැඩසටහන සඳහා ලබාගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 18,437.00 |
| පෙබ:14 | 250 | අයි.ටී.විජේතුංග<br>දෙ/ප්‍රා/සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු කාර්මික නිලධාරී විජේතුංග මයාට 2021 නොවැම්බර්,දෙසැම්බර් හා 2022 ජනවාරි යන මාස සඳහා දීමනාව ගෙවීම. | 114,597.00 |
| පෙබ:14 | 251 | මු.හා.ක-පී.ජී.සෙනවිරත්න<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 11,250.00 |
| පෙබ:14 | 252 | මු.හා.ක-අයි.ඩී.ඩබ්.එස්.කුමාර<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 5,818.00 |
| පෙබ:14 | 253 | මු.හා.ක-ඩී.ජී.එන්.පී.ජයසිංහ<br>2021 දෙසැම්බර් මස අතිකාල ගෙවීම. | 8,866.00 |
| පෙබ:15 | 254 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>බොබ්කැට් යන්ත්‍රය සඳහා 2022 ජනවාරි මස ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 12,100.00 |
| පෙබ:15 | 255 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජනවාරි මස RD-9461 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 21,780.00 |
| පෙබ:15 | 256 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජනවාරි මස LL-7582 දරණ කෘ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 30,250.00 |

| | | | |
|---|---|---|---|
| පෙබ:15 | 257 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජනවාරි මස PF-7369 දරණ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 60,500.00 |
| පෙබ:15 | 258 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජනවාරි මස තණකොල කපන මැෂිම සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 17,035.00 |
| පෙබ:15 | 259 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජනවාරි මස 250-4053 දරණ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 29,700.00 |
| පෙබ:15 | 260 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජනවාරි මස QU2004 ත්‍රීවිලරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 6,738.00 |
| පෙබ:15 | 261 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජනවාරි මස RE-2258 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,840.00 |
| පෙබ:15 | 262 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජනවාරි මස RD-5928 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 9,680.00 |
| පෙබ:15 | 263 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජනවාරි මස RD-6441 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 9,680.00 |
| පෙබ:15 | 264 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජනවාරි මස RC-1403 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 42,020.00 |
| පෙබ:15 | 265 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජනවාරි මස RD-8018 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 33,880.00 |
| පෙබ:15 | 266 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජනවාරි මස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී 252-3916 දරණ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 19,212.00 |
| පෙබ:15 | 267 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජනවාරි මස 42-7498 දරණ ගිලන් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,330.00 |
| පෙබ:15 | 268 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123537 දරණ WIFI රවුටරයේ 2022 ජනවාරි මස බිල්පත ගෙවීම | 815.51 |
| පෙබ:15 | 269 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123538 දරණ WIFI රවුටරයේ 2022 ජනවාරි මස බිල්පත ගෙවීම | 815.51 |
| පෙබ:15 | 270 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123539 දරණ WIFI රවුටරයේ 2022 ජනවාරි මස බිල්පත ගෙවීම | 815.51 |

| | | | |
|---|---|---|---|
| පෙබ:15 | 271 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123540 දරණ WIFI රවුටරයේ 2022 ජනවාරි මස බිල්පත ගෙවීම | 815.51 |
| පෙබ:15 | 272 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-2222575 දරණ කාර්යාලීය දුරකථනයේ 2022 ජනවාරි මස බිල්පත ගෙවීම. | 8,875.61 |
| පෙබ:15 | 273 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු. අ.036-2222534 දරණ ගරු සභාපතිතුමාගේ කාර්යාලීය දුරකතනයේ 2022 ජනවාරි මස බිල්පත ගෙවීම. | 7,705.96 |
| පෙබ:15 | 274 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි. අ.2692684915 දරණ පනාවල මහජන පුස්තකාලයේ 2021/12/30 සිට 2022/02/02 දක්වා බිල්පත ගෙවීම. | 276.60 |
| පෙබ:15 | 275 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:6321102601 දරණ පනාවල පෙර පාසලේ 2021/12/30-2022/02/02 දක්වා බිල්පත ගෙවීම. | 514.50 |
| පෙබ:15 | 276 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7970101003 දරන දෙ/නව ප්‍රා/සභා කාර්යාලයේ 2022 ජනවාරි මස බිල්පත ගෙවීම. | 62,572.80 |
| පෙබ:15 | 277 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7991487016 දරණ දෙ/පැරණි සභාවේ 2021/12/30-2022/01/29 දක්වා බිල්පත ගෙවීම. | 1,557.60 |
| පෙබ:15 | 278 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7918009002 දරණ තල්දූව පුස්තකාලයේ 2022/01/15-2022/02/11 දක්වා බිල්පත ගෙවීම. | 642.54 |
| පෙබ:15 | 279 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7909280106 දරන ඊ/ආදාහනාගාරයේ 2021/12/26-2022/01/25 දක්වා බිල්පත ගෙවීම. | 4,137.90 |
| පෙබ:15 | 280 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/068/152/18 දරණ මාගම්මන ආයුර්වේදයේ 2021/12/24-2022/01/24 දක්වා බිල්පත ගෙවිම. | 612.48 |
| පෙබ:15 | 281 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/001/18 දරණ දෙහිඕවිට පැරණි ප්‍රා/සභා කාර්යාලයේ 2022/01/04-2022/02/03 දක්වා බිල්පත ගෙවිම. | 9,341.61 |
| පෙබ:15 | 282 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/073/13 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ 2022/01/04-2022/02/03 දක්වා බිල්පත ගෙවිම. | 441.80 |
| පෙබ:15 | 283 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/054/16 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ 2022/01/03-2022/02/02 දක්වා බිල්පත ගෙවිම. | 3,287.53 |
| පෙබ:15 | 284 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/035/18 දරණ දෙ/ පොදු ජල කණුවේ 2022/01/09-2022/02/08 දක්වා බිල්පත ගෙවිම. | 324.01 |

| | | | |
|---|---|---|---|
| පෙබ:15 | 285 | මොබිටෙල් පුද්ගලික සමාගම<br>ගි:අං: 18180420 දරණ පෙරටු කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන කෙටි පණිවුඩ සේවාවේ 2021/12/25-2022/01/24 දක්වා බිල්පත ගෙවීම. | 318.24 |
| පෙබ:17 | 286-293 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින්<br>බොබ්කැට් යන්ත්‍රයේ 2022.01.08-2022.02.10 දක්වා කාලය තුළ වරින්වර ඇතිවූ ටයර් පැච් හා ටියුබ් පැච් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 8,400.00 |
| පෙබ:17 | 294 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින්<br>250-4053 දරණ කැබ් රථයේ ටියුබ් පැච් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 200.00 |
| පෙබ:17 | 295 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින්<br>LL7582 කැබ් රථයේ ටයර් මාරු කිරීම (කම්පැක්ටරයේ ටයර් සමඟ) වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,000.00 |
| පෙබ:17 | 296 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින්<br>RD8018 දරණ ට්‍රැක්ටරයේ ටයර් පැච් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 600.00 |
| පෙබ:17 | 297 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින්<br>RC1403 ට්‍රැක්ටරය සඳහා 750*16 ටියුබ් 01ක් හා 16' ට්රේප් 01ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,400.00 |
| පෙබ:17 | 298 | දෙහිඕවිට ටයර් ට්‍රේඩින්<br>RC1403 ට්රැක්ටරය සඳහා ඇමරොන් 90Am බැටරියක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 29,200.00 |
| පෙබ:17 | 299 | රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව<br>ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 38,171.45 |
| පෙබ:17 | 300 | කොලොන්න සර්විස් සෙන්ටර්<br>RC1403 අංක දරණ ට්‍රැක්ටරය සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම.(2022 පෙබරවාරි) | 19,485.00 |
| පෙබ:18 | 301 | මු.හා.ක-එච්.ඒ.රංගන තිලකරත්න<br>ගමන් වියදම් ගෙවීම. | 1,700.00 |
| පෙබ:18 | 302 | මු.හා.ක-එස්.එච්.ඩී.ආර්.නයනානන්ද<br>ශ්‍රම අභිමන් උළෙලේ කාර්යන් සඳහා අතින් වියදම් කල මුදල් ලබා ගැනීම. | 2,343.00 |
| පෙබ:18 | 303 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>නිවාඩු දින සේවයෙහි වැටුප් ගෙවීම. | 11,965.00 |
| පෙබ:21 | 304 | වී.ඒ.එම්.ගම්ලත්<br>ගංගා වැලි කියුබ් 3.75 ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 45,000.00 |
| පෙබ:21 | 305 | නිපෝන් හාඩ්වෙයාර් ස්ටෝර්ස්<br>තණකොල කපන යන්ත්‍රය සඳහා කැපුම් තල 4ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,475.00 |
| පෙබ:21 | 306 | එච්.ඒ.ටී.ටී.හෙට්ටිආරච්චි<br>විෂබීජනාශක දියර ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 5,600.00 |

| | | | |
|---|---|---|---|
| පෙබ:22 | 307 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාවට අයත් යතුරුපැදිය හා ට්‍රේලරය සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 2,000.00 |
| පෙබ:22 | 308 | මු.හා.ක-ඊ.පී.එස්.සමන්ලතා<br>හෙළබොජුන් අලෙවි පියසේ ඉබියතුරු මිලදී ගැනීම සඳහා අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 2,640.00 |
| පෙබ:22 | 309 | මු.හා.ක-ආර්.එම්.එච්.රත්නායක<br>ආයුර්වේද සායනයේ සංග්‍රහ වියදම් ගෙවීම. | 1,470.00 |
| පෙබ:22 | 310 | මු.හා.ක-බී.එස්.එස්.කුමාරි<br>2021 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව සැකසීම සඳහා අතින් වියදම් වූ මුදල් ලබා ගැනීම. | 700.00 |
| පෙබ:22 | 311 | එච්.ඒ.ටී.ටී.හෙට්ටිආරච්චි<br>විෂබීජනාශක දියර ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 8,400.00 |
| පෙබ:22 | 312 | එස්.ඇන්ඩ්.ජේ.එන්ටප්‍රයිසස්<br>දිගලවත්ත කසල කළමණාකරන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය යන්ත්‍ර කුලියට ගැනීම සඳහා ගෙවීම් කිරීම. | 30,250.00 |
| පෙබ:22 | 313 | ජී.ජී.යසස් සුධාරක උපසේන<br>250-4053 කැබ් රථයේ ඕල්ටනේටරයේ කොටස් අලුතින් දැමීම හා වැඩකුලිය වෙනුවෙන් මුදල් ගෙවීම. | 12,350.00 |
| පෙබ:22 | 314 | කොලොන්න සර්විස් සෙන්ටර්<br>RD6441 අංක දරණ ට්‍රැක්ටරය සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම.(2022 පෙබරවාරි) | 19,485.00 |
| පෙබ:22 | 315 | ටෙෂ්මි ඉලෙක්ට්‍රිකල්ස්<br>L.E.D කෝබ්‍රා වීථි පහන් කට්ටල 5ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 73,675.00 |
| පෙබ:22 | 316 | දිලාන් ජයසිංහ ප්‍රවාහන සේවය<br>දිගලවත්ත පූර්ව මිශ්‍රණ අංගනය සැකසීම සඳහා ලබාගත් ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් ගෙවීම. | 62,000.00 |
| පෙබ:22 | 317 | දේශීය ණය සහ සංවර්ධන අරමුදල<br>තල්දූව පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට දේශිය ණය සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ණය මුදලේ මුදල හා පොළී මුදල ගෙවීම.(2022 පෙබරවාරි සඳහා) | 156,136.31 |
| පෙබ:22 | 318 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජනවාරි මස LL6937 දරණ ටිපර් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 13,750.00 |
| පෙබ:22 | 319 | නිපෝන් හාඩ්වෙයාර් ස්ටෝර්ස්<br>ප්‍රා/ සභා සංකීර්ණයේ පොදු වැසිකිළියේ ටැප් එකක් අලුතින් යෙදීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 460.00 |
| පෙබ:22 | 320 | නිපෝන් හාඩ්වෙයාර් ස්ටෝර්ස්<br>දෙහිඕවිට එළු කුකුල් මස් කඩයේ දොර අලුත්වැඩියා කිරීම සඳහා ලබාගත් ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,120.00 |
| පෙබ:22 | 321 | එච්.එම්.වී.මෝටර්ස් ඇන්ඩ් ඔයිල් මාර්ට්<br>JCB යන්ත්‍රයේ අලුත්වැඩියා සඳහා හයිඩ්රොලික් ලීටර් 50ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 35,000.00 |

| | | | |
|---|---|---|---|
| පෙබ:23 | 322 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි. අ.7921106404 දරණ දෙහිඕවිට මහජන පුස්තකාලයේ E-පුස්තකාලයේ 2022/01/09 සිට 2022/02/10 දක්වා බිල්පත ගෙවීම. | 2,179.80 |
| පෙබ:23 | 323 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 6316208308 දරන දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ 2022/02/11-2022/02/13 දක්වා බිල්පත ගෙවීම. | 4,119.60 |
| පෙබ:23 | 324 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 පෙබරවාරි මස දෙ/ප්‍රා/සභාවේ ස්ථිර සේවක වැටුප් ගෙවීම. | 3,203,083.36 |
| පෙබ:25 | 325 | මු.හා.ක-එච්.ඒ.ආර්.එස්.තිලකරත්න<br>කහනාවිට ඇල්ල සංවර්ධනය සඳහා ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනයේ නිර්දේශ වාර්තාවක් ලබා ගැනීමට අතින් ගෙවූ මුදල් ලබා ගැනීම. | 19,950.00 |
| පෙබ:25 | 326 | මු.හා.ක-එච්.එම්.එස්.නන්දකුමාර<br>දිගලවත්ත පූර්ව මිශ්‍රණ අංගනය කොන්ක්‍රීට් කිරීමට වයිබ්රේෂන් ප්ලේට් තලන යන්ත්‍රය හා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර කුලියට ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 10,300.00 |
| පෙබ:25 | 327 | මු.හා.ක-සුධීර වානක<br>250-4053 කැබ් රථයේ A/C පද්ධතියේ කොටස් අලුතින් දැමීම හා අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,215.00 |
| පෙබ:25 | 328 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>සුළු මුදල් අග්‍රිමය අලුත් කිරීම. | 975.00 |
| පෙබ:25 | 329 | මු.හා.ක-ඊ.පී.එස්.සමන්ලතා<br>දෙ/ප්‍රා/සභාවේ ළමා හා කාන්තා ආරක්ෂණ කමිටු රැස්වීම සඳහා අතින් වියදම් කල සංග්‍රහ වියදම් ලබා ගැනීම. | 910.00 |
| පෙබ:25 | 330 | මු.හා.ක-ඊ.පී.එස්.සමන්ලතා<br>දෙ/ප්‍රා/සභාවේ ඒකාබද්ධ උපාය මාර්ගික සැලැස්ම සැකසීම සඳහා පැවැත්වූ රැස්වීමේ සංග්‍රහ වියදම් ගෙවීම. | 4,165.00 |
| පෙබ:25 | 331 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ක්‍රීඩා පිටිය කුලියට ලබාදීම වෙනුවෙන් තැන්පත් කරන ලද මුදල් ආදායමට ගැනීම.(No Cash) | 10,000.00 |
| පෙබ:25 | 332 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ශ්‍රවණාගාරය කුලියට ලබාදීම වෙනුවෙන් තැන්පත් කරන ලද මුදල් ආදායමට ගැනීම.(No Cash) | 20,000.00 |
| පෙබ:25 | 333 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ශ්‍රවණාගාරය කුලියට ලබාදීම වෙනුවෙන් තැන්පත් කරන ලද මුදල් ආදායමට ගැනීම.(No Cash) | 10,000.00 |
| පෙබ:25 | 334 | බී.ජී.තිලංග බුද්ධික මුදලිගේ<br>2022 වර්ෂයේ ජනවාරි මස ඉඹුල්පිටිය මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,750.00 |
| පෙබ:25 | 335 | ඒ.ඩී.චන්ද්‍රසේන<br>2022 වර්ෂයේ ජනවාරි මස තල්දුව මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,350.00 |

| | | | |
|---|---|---|---|
| පෙබ:25 | 336 | එම්.එච්.ඩී.එස්.සුගතපාල<br>2022 වර්ෂයේ ජනවාරි මස මාගම්මන මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,850.00 |
| පෙබ:25 | 337 | ඩබ්.ඒ.විකුම් ආනන්ද<br>2022 වර්ෂයේ ජනවාරි මස දෙහිඕවිට මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 8,800.00 |
| පෙබ:25 | 338 | කේ.ඒ.පී.කුරුප්පු<br>2022 වර්ෂයේ ජනවාරි මස පනාවල මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 6,920.00 |
| පෙබ:25 | 339 | එල්.එස්.ආනන්ද<br>PF7369 දරණ කැබ් රථයට දුනු කොල අලුතින් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 6,300.00 |
| පෙබ:25 | 340 | එම්.පී.ජයසිංහ<br>නෙස්කැෆේ පිටි පැකට් 03ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,800.00 |
| | | | **7,035,806.97** |
| පෙබ:15 | 4 | සේවක ණය<br>ටී.කේ.ඉන්දික ප්‍රේමරත්න<br>ආපදා ණය අත්තිකාරම් ගෙවීම. | 125,000.00 |
| පෙබ:15 | 5 | සේවක ණය<br>කේ.එම්.ටී.එම්.කපුකොටුව<br>ආපදා ණය අත්තිකාරම් ගෙවීම. | 250,000.00 |
| | | **එකතුව** | **7,410,806.97** |

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(iii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සියළුම ඇළ රක්ෂිත 2019 අංක 11 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධිත) පනතේ 4 (අ) 1 වගන්තිය යටතේ ගරු වෙරළ සංරක්ෂණ පහත් බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කළ යුතුව ඇත. එබැවින් දෙහිඕවිට ප්‍රාදේශිය සභා බල සීමාව තුළ පිහිටි ජලය බැස යාමට සලස්වා ඇති හෝ ජලය බැස යාමේ අරමුණින් නිර්මාණය කර ඇති හෝ ස්වාභාවික සියලු ප්‍රධාන ඇළ මාර්ග , සියළු අතුරු ඇළ මාර්ග, හා සියළු පෝෂිත ඇළ මාර්ගයන්හි මතු පිට පළල අනුරූප වන සේ පහත ලේඛනයේ දක්වා ඇති පරිදි ඉවුරු දෙකෙහිම ඉවුරේ මායිමේ සිට දුර ප්‍රමාණයක් රක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම සුදුසු බව යෝජනා කරමි.

| ඇළෙහි මතු පිට පළල (මීටර්) | ඇළ ඉවුරේ මායිමේ සිට රක්ෂිතය | |
|---|---|---|
| | විවෘත ඇළ සඳහා (මීටර්) | මතුපිට ආවරණය කරන ලද ඇළ සඳහා (මීටර්) |
| 1.0 – 1.2 දක්වා | 1.0 | 0.3 |
| 1.3 – 3.0 | 2.0 | 1.0 |
| 3.1 – 4.5 | 2.75 | 1.0 |
| 4.6 – 6.0 | 3.5 | 1.5 |
| 6.1 – 9.0 | 4.5 | 1.5 |
| 9.0 ට වැඩි | 6.5 | 2.0 |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුෂාර අමරසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01 (iv) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගිණුම් විෂයේ කටයුතු කළමනාකරණ සේවා නිළධාරිණී III නිරාශා පත්මසිරි මහත්මිය වෙත පවරා ඇත. මෙම නිළධාරිණිය නවක නිළධාරිණියක් වන අතර මීට පෙර ගිණුම් විෂය සම්බන්ධ කටයුතු කළ නිලධාරිණිය ස්ථාන මාරු වූ බැවින් මැයට එම කටයුතු පවරන ලදී. එබැවින් තවදුරටත් මැය ගිණුම් කටයුතු පිළිබඳව පුහුණු කළ යුතු බැවින් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මඟින් මෙහෙය වන පළාත් පාලනය පිළිබඳ මූල්‍ය කළමණාකරන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම් කර ඇත. ඒ සඳහා අනුමැතිය ලබා දීමටත් එම පාඨමාලාව සඳහා වැය වන රු. 60,000.00 ක පාඨමාලා ගාස්තුව සභා අරමුදලින් දැරීමත් සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01 (v) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙම සභාවේ සේවා ගිවිසුම් මත සේවය කරනු ලබන පහත නම් සඳහන් සේවක මහතුන්ගේ ගිවිසුම්ගත කාලය ඉදිරි වර්ෂයක කාලයක් සඳහා නැවත දීර්ඝ කිරීම සුදුසු බව යෝජනා කරමි.

| අනු අංකය | සේවකයාගේ නම | තනතුර | සේවා ගිවිසුම අවසන් වන දිනය |
|---|---|---|---|
| 01 | අයි.ආර්.එම්.පී.රත්නායක මහතා | සෞඛ්‍ය කම්කරු | 2022.03.28 |
| 02 | යූ.එල්.එස්.එන්. ජයතිලක මෙ/ය | පුස්තකාල සහායිකා | 2022.04.09 |
| 03 | පී.ඊ.එන්.එන්.කුමාරවංශ මහතා | මුරකරු | 2022.04.18 |
| 04 | කේ.පී.රාජපක්ෂ මිය | සෞඛ්‍ය කම්කරු | 2022.04.18 |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුෂාර අමරසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01 (vi) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එම්.ඒ.සේනාරත්න මහතා මෙම සභාවේ සෞඛ්‍ය කම්කරු ස්ථිර තනතුරේ සේවය කර වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 2019.03.10 දින සිට සේවයෙන් විශ්‍රාම ගන්වා ඇත. බල ප්‍රදේශයේ කසළ එක් රැස් කිරීමේ කාර්ය සඳහා දැනට සේවයේ යෙදී සිටින සෞඛ්‍ය කම්කරුවන් ප්‍රමාණවත් නොවන අතර , සේවයේ යෙදී සිටින සෞඛ්‍ය කම්කරුවන්ද වරින් වර සේවයෙන් ඉවත් වීම මත කසළ එක් රැස් කිරීමේ කටයුතු පවත්වාගෙන යාම ගැටළුසහගත වී ඇත. ඉහත නම් සඳහන් සේවක මහතා ඔහුට පවරා ඇති රාජකාරි කාර්යක්ෂමව ඉටු කරන අතර ඔහුගේ සේවය තව දුරටත් සභාවට අවශ්‍ය වී ඇත. එහෙත් එම සේවක මහතා සේවයෙන් විශ්‍රාම ගන්වා ඇතත් ඔහුට විශ්‍රාම වැටුපක් හිමි නොවන බැවින් සේවා අවශ්‍යතාවය සලකා දෛනික ගෙවීම් මත ඔහු සේවයට යොදවා ගැනීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01 (vii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 අනුව රජයේ නිලධරයන්ට හා විශ්‍රාමිකයන්ට රු 5000.00 මාසික දීමනාව ලබා දීම යටතේ දෛනික වැටුප් ලබන නිලධරයන් සඳහාද එම දීමනාව ලබා දීම සඳහා හිමිකම් ඇති බව දක්වා ඇත. ඒ අනුව මෙම සභාවේ දෛනික වැටුප් මත සේවයේ යෙදී සිටින සංඛ්‍යාව 28 කි. මොවුන් සඳහා වැටුප් ලබා දෙනු ලබන්නේ සභා අරමුදලින් වන අතර 2022 වර්ෂය සඳහා අය වැය ඇස්තමේන්තු ගත කිරීමේදී රු. 5000.00 දීමනාව අදාල කරගෙන නොමැති බැවින් අතිරේකව රුපියල් විසි ලක්ෂ හැත්තෑ හය දහසක මුදලක් සභා අරමුදලින් ඒ සඳහා දැරීමට සිදුවේ. මෙයට සාපේක්ෂව ආදායමක් ජනනය නොවන බැවින් 2022 වර්ෂයේදී ඔවුන් සඳහා පහත පරිදි අදාල දීමනාව ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

- සේවා කාලය වසර 05ට වැඩි දෛනික වැටුප් ලබන සේවකයන් සඳහා මාසිකව - රු. 5000.00
- සේවා කාලය වසර 05ට අඩු දෛනික වැටුප් ලබන සේවකයන් සඳහා මාසිකව - රු. 3000.00

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

- සේවා කාලය වසර 05ට අඩු දෛනික වැටුප් ලබන සේවකයන් සඳහා මාසිකව - රු. 3000.00

**01 (viii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අටුළුගම ග්‍රාමනිලධාරි වසමෙහි අටුළුගම දුම්රිය රක්ෂිතයේ අංක 184/1 ,අටුළුගම ,දෙහිඕවිට ලිපිනයෙහි පදිංචි රංචාගොඩ ගමගේ ක්ලෙමන්ට් දේශප්‍රිය රංචාගොඩ යන අය භුක්ති විඳින මු.පි.කෑ.3097 හි කැබලි අංක 01 හා මු.පි.කෑ.3059 හි කැබලි අංක 90 ඉඩම් කොටස සඳහා දිර්ඝ කාලීන බදු බලපත්‍ර ලබාදීම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් දෙහිඕවිට ප්‍රාදේශිය සභාව වෙතින් එකගතාවය ලබා දිම සඳහා ඉල්ලුම් කර තිබේ.

ඒ අනුව කාර්මික නිලධාරි විසින් ස්ථාන පරික්ෂණ සිදුකර නිර්දේශ අනුව රංචාගොඩ ගමගේ ක්ලෙමන්ට් දේශප්‍රිය රංචාගොඩ යන අය සඳහා දිර්ඝ කාලීන බදු බලපත්‍ර ලබාදීම සඳහා සුදුසු බව යෝජනා කරමි.

| අනු අංකය | ඉල්ලුම් කරුගේ නම හා ලිපිනය | දේපල ස්භාවය | බල පත්‍ර අයදුම් කරන ඉඩම් කොටස | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01 | රංචාගොඩ ගමගේ ක්ලෙමන්ට් දේශප්‍රිය රංචාගොඩ<br>අංක 184/1 ,අටුළුගම, දෙහිඕවිට | ගෙවත්ත ස්ථර ගොඩනැගිල්ලක කොටසක්<br><br>වත්ත මිශ්‍ර වගාව | මුල් පිඹුරු කැබලි අංක 3097කැබලි අංක 01 කොටස හා<br>මු.පි.කෑ.3059 හි කැබලි අංක 90 වූ ඉඩම් කොටස | හෙක්ටයාර් 0.0076<br><br>හෙක්ටයාර් 0.0098 |

මෙම යෝජනාව ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා:**

පසුගියදා පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සඳහා තල්දූව හේමන්ත මහතාගේ ඉඩමට දීර්සකාලීන බදු බලපත්‍ර ලබා දීම සම්බන්ධ ගැටළුවක් පැමිණි බවත් එහිදී ඔහු විසින් ඉල්ලූ දීර්ඝ කාලීන බදු බලපත්‍රය ලබා දිය නොහැකි බවට නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවෙන්ම තීරණය කළ බවත් එය අඩු තරමින් මේ ආකාරයට මහා සභාවට හෝ ඉදිරිපත් නොකළ බව පැවසීය. එකම

කරුණ සම්බන්ධයෙන් පුද්ගලයින් දෙදෙනෙකුට දෙයාකාරයකට නීතිය ක්‍රියාත්මක වන්නේ ඇයිද යන්න විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා වැරදි අර්ථ කථනයක් මේ සිදුවීමට ලබා දෙන බවත් පෙර සඳහන් කළ බිම් කොටස සභාව සතු භූමියක් අසල තිබෙන බිම් කොටසක් බවත් එයට සභාවට යම් අයිතියක් පවතින බවත් පෙන්වා දෙන ලදී. එහිදී නිවාස කමිටුවෙන් සිදු කළ නිර්දේශය අනුව ඒ ඉඩමේ අයිතිය සභාව සතු නිසා එය සභාවට පවරා දෙන ලෙසත් පසුව සභාව මඟින් එය අදාල පුද්ගලයාට ලබා දීමට කටයුතු කරන බවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දන්වා යැවූ බව පැවසීය.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

තමන් නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව නියෝජනය කරනු ලබන බවත් අටුළුගම රංවාගොඩ මහතාගේ ඉඩමට සභාවේ අයිතියක් නොමැති ඉඩමක් බවත් පෙන්වා දෙන ලදී. නමුත් තල්දූව හේමන්ත මහතාගේ ඉඩම එක් පසෙකින් දුම්රිය රක්ෂිතයටත් අනෙක් පසින් සභාව සතු ඉඩමකටත් සම්බන්ධ වී ඇති ඉඩමක් බැවින් ඒ ඉඩම සම්බන්ධයෙන් පෙර සඳහන් කළ ආකාරයට ක්‍රියා කිරීමට සිදු වූ බව පෙන්වා දෙන ලදී.

(සභාව සෝෂාකාරී)

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ගැටළුසහගත තත්ව නොමැති අවස්ථාවල සෘජුව සභා අනුමැතියක් ලබා ගැනීමට මහා සභාවට යොමු කරන බවත් එසේ නොමැතිව යම් ගැටළුකාරී තත්වයක් තිබූ බැවින් නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවට එම ගැටළුව යොමු කරන ලද බවත් පෙන්වා දෙන ලදී. එම කරුණට විරුද්ධත්වයක් තිබුණා නම් කාරක සභා සාමාජිකයෙකු වශයෙන් එම අවස්ථාවේ කාරක සභාවේ නිර්දේශයට විරුද්ධ වීමට තිබූ බවත් එසේ නොකර සභාවේදී ඒ තීරණ සම්බන්ධයෙන් විවේචන සිදු කිරීම සාධාරණ නොවන බවත් පවසා සිටියේය. තමන් හැම විටම අපක්ෂපාතී තීරණ ගන්නා බවත් එම නිසා ගැටළු සහගත් අවස්ථා ඇති විට මහජන නියෝජිතයන් 10 දෙනෙකු නියෝජනය කරන කාරක සභාව වෙත අදාල ගැටළුව යොමු කළ බවත් පවසා සිටියේය. එසේ නොමැති නම් තමන්ට අභිමත ආකාරයට තීරණ ගැනීමේ හැකියාව තිබූ නමුත් තමන් එසේ සිදු නොකරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

මේ යෝජනාව අනුව ඒ හිමිකම් ප්‍රධානයට ප්‍රාදේශීය ලේකම්ගේ විරුද්ධත්වයක් නොමැති බවත් ඒ සම්බන්ධයෙන් සභාවේ මතය පමණක් විමසන බවත් පෙනී යන බව පැවසූ එතුමා ඒ අනුව සභාවට සිදු කිරීමට ඇත්තේ ඉතාමත් සරල කාර්යක් බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

කාර්ය සරල වුවත් එය විනිවිද භාවයකින් යුක්තව සිදු කළ යුතු බවත් පවසා සිටියේය. රංවාගොඩ මහතාගේ ඉඩම සම්බන්ධයෙන් ගැටළුවක් නොමැති වීම මත ඒ සඳහා මහා සභා අනුමැතියකින් තීරණය ලබා දීමට ක්‍රියා කළ බවත් නමුත් තල්දූව හේමන්ත මහතාගේ ඉඩමේ හිමිකම සම්බන්ධ ගැටළුවක් ඇති බැවින් එය කාරක සභාවට යොමු කර පරීක්ෂා කර බලා වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කළ බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

දුම්රිය රක්ෂිත සම්බන්ධ ගැටළු වල බලධාරියා වන්නේ ප්‍රාදේශීය ලේකම් බවත් පැරණි දුම්රිය රක්ෂිතයේ දහස් ගණනක් දෙනා ජීවත් වන බවත් ඔවුන් සියළුදෙනාම වෙත ලබා දී ඇත්තේ රජයේ බලපත්‍ර බවත් පැවසීය.එම නිසා දීර්ඝකාලීන බලපත්‍රයක් ලබා දිම සඳහා සභාවේ අනුමැතිය මේ ආකාරයට ඉල්ලා සිටින්නේ කුමන හේතුවක් නිසාද යන්න ගැටළුවක් බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා:**

මෙය වසර 15ක පමණ කාලයක සිට නොවිසඳුනු ගැටළුවක් බවත් මෙහි සඳහන් පුද්ගලයන් දෙපලම දුම්රිය රක්ෂිතයේ සිටින අය වන අතර එක් කාලයකට මේ ගැටළු උද්ගත වන අතර කාලයක් නිහඬව තිබී නැවත ඉස්මතු වන කරුණක් බවත් පෙන්වා දෙන ලදී. මේ ස්ථානය තමන් සහ ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා විසින් පරීක්ෂා කළ බව පැවසූ එතුමා ඔහු විසින් එම ස්ථානයේ සිදු කරනු ලබන ඉදිකිරීමත් කිසිදු ගැටළුවක් නොමැතිව සිදු කෙරෙමින් පවතින බව පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙම යෝජනාව තමන් විසින් ඉල්ලා අස් කර ගන්නා බවත් නැවත එම ගැටළුව නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව වෙත යොමු කර පැහැදිලි පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරන බවත් පවසා සිටියේ

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා:**

මේ සම්බන්ධයෙන් තමන්ටද යමක් ප්‍රකාශ කිරීමට ඇති බව පවසා සිටියේය. මෙම යෝජනාවෙන් සංවාද වන්නේ දීර්ඝ කාලීන බදු බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙන්ද කෙටිකාලීන බදු බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙන්දැයි විමසා සිටියේය. තමන් දන්නා තරමින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමෙන් ලබා දෙනු ලබන්නේ කෙටි කාලීන බදු බලපත්‍ර පමණක් බවත් දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබා නොදෙන බවත් පවසා සිටියේය. එම නිසා එක් පුද්ගලයෙකුට පමණක් දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබා දීම අනවශ්‍ය බවත් මෙහි සඳහන් පුද්ගලයන් සඳහාත් සභා තීරණයක් ලබා ගෙන කෙටි කාලීන බදු බලපත්‍ර ලබා දීමට කටයුතු කරමුයැයි පවසා සිටින ලදී.

(සභාව ඝෝෂාකාරී)

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙම යෝජනාව තමන් විසින් ඉල්ලා අස් කර ගත් බවත් කාරක සභාවට යොමු කිරීමට කටයුතු කරන බවත් පවසා සිටියේය. එසේම කාරක සභා රැස්වීම් වලදී නිර්දේශ ලබා දුන් ඇතැම් සිදුවීම් සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන් නොදන්නේ ඔවුන්ගෙන් බහුතරයක් කාරක සභා රැස්වීම් සඳහා විධිමත් ලෙස සහභාගී නොවන නිසා බව පැවසූ එතුමා බොහෝ අවස්ථාවල ඔවුන් නොපැමිණීම මත මෙවැනි ගැටළු ඇති වන බැවින් කාරක සභා රැස්වීම් සඳහා නියමිත දිනයේ නොවරදවාම සහභාගී වන ලෙස සියළුම මහජන නියෝජිතයන්ට දන්වා සිටියේය.

**01 (ix) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් ගම්සභා ආඥා පනතේ 300 වගන්ති ප්‍රකාරව පැවරුම් නියෝගයකට අනුව හිමිවූ දැරණියගල මාර්ගයේ පිහිටි පැරණි සභා කාර්යාලය පිහිටි ඉඩම දෙහිඕවිට පොලිස් ස්ථානය පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය වෙත ලබා දෙන ලෙස සීතාවක කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි විසින් ඉල්ලුම් කර ඇත. ඒ අනුව දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් දැරණියගල මාර්ගයේ පිහිටි පැරණි සභා කාර්යාලය පිහිටි අතමුණේ කුරහන් වත්ත නැමති ඉඩම දෙහිඕවිට පොලිස් ස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය වෙත පවරා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

පානීය ජලය ලබා ගැනීමේ අයිතියක් ඕනෑම පුරවැසියෙකුට තිබෙන බවත් අද දින මහා සභා රැස්වීමට පැමිණි මන්ත්‍රීවරුන් සඳහා පානීය ජල බෝතල් වෙනුවට ජල වීදුරු තබා තිබීමට හේතුව කුමක්ද යන්නත් විමසා සිටියේය. මෙම ජලය විශ්වාසයකින් යුක්තව පානය කිරීමට හැකිද යන්නත් විමසා සිටියේය.

(සභාව සෝෂාකාරී)

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මීට පෙර මහා සභා රැස්වීම් කීපයකදීම එක් මන්ත්‍රීවරයෙක් කාර්යාලයට පානීය ජල බෝතල් ගෙන ඒම සම්බන්ධයෙන් දිගින් දිගටම ප්‍රශ්න කළ බවත් ඒ අවස්ථාවේදී මෙම ජලයේ අවශ්‍යතාවට පිළිබඳව කතා කිරීමට මෙම සභාවේ කිසිදු මහජන නියෝජිතවරයෙකු ඉදිරිපත් නොවූ බව සිහිපත් කර සිටියේය. එම අවස්ථාවේ ඒ සම්බන්ධයෙන් මන්ත්‍රීවරු නිහඬව සිටීමෙන් අදහස් වූයේ එම මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයට එකඟ බව නිසා සභාවට පිටතින් ජලය රැගෙන ඒම නැවැත්වීමට තීරණය කර ඇති බව පවසා සිටියේය.

(සභාව සෝෂාකාරී)

(ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.15)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා:**

කාර්යාලයේ නිලධාරීන්ට පානීය ජල බෝතල් ලබා ගැනිමට විශාල පිරිවැයක් වියදම් වන බවට චෝදනා වූ බැවින් මේ ක්‍රියා මාර්ගය ගැනීමට සිදු වූ බවත් පාසල් වයසේදී ජල කරාමයෙන් ජලය පානය කරන විට එම ජලයේ ප්‍රමිතිය පිළිබඳව සොයා නොබැලූ නිසා අද මෙම ජලය පානය කිරීමට සිදු වූ විට ඒ සම්බන්ධයෙන් එතරම් සිතිය යුතු නොවන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

යෝජනා අංක 01 (ix) යටතේ දැරණියගල මාර්ගයේ පිහිටි පැරණි සභා කාර්යාලය පිහිටි ඉඩම දෙහිඕවිට පොලිස් ස්ථානය ස්ථාපිත කිරීම සඳහා ලබා දීමට යෝජනා කර තිබෙන බවත් එය ලබා දීමේදී ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු යම් කරුණු තිබෙන බව පෙන්වා දෙන ලදී. මෙම අතමුණේ කුරහන් වත්ත නැමති ඉඩමේ මුළු භූමි ප්‍රමාණය කොපමණද යන්න දැන ගත යුතු බවත් එහි ඔප්පුව සභාව සතුව තබේද යන්න සොයා බැලිය යුතු බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අද දින මේ සඳහා සභා අනුමැතිය ලද පසු ඒ සඳහා පිඹුරක් සකස් කර එයට ඔප්පුවක් සාදා එයත් සභාවේ අනුමත කර ලබා දීමට අදහස් කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

මෙම ඉඩම වටිනා ඉඩමක් බවත් පැරණි ගම් සභා ගොඩනැඟිල්ල පැවති සහ ප්‍රාදේශීය සභා ස්ථාපිත කළ පසු පළමු සභාව පැවති ගොඩනැඟිල්ල ලෙස මෙය ඓතිහාසික වැදගත්මකින් යුක්ත බවත් එහි වටිනා ආලේඛ්‍ය චිත්‍රයක් තිබෙන නිසාත් තමන් අවස්ථා ගණනාවකදී හිටපු සභාපතිතුමන්ට මේ ස්ථානය සංක්ෂණය කර පවත්වාගෙන යන ලෙස ඉල්ලා සිටියත් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු නොකළ බව පවසා සිටින ලදී. අද වන විට එය විවිධ පුද්ගලයන් විසින් බලහත්කාරයෙන් අල්ලා ගැනීමට කටයුතු කර ඇති බව පැවසූ එතුමා සභාව සතු දේපල ආරක්ෂා කර ගැනීමේ වගකීම අප සතුව ඇති බව පවසා සිටියේය.පොලීසියක් නගරයක් තුළ ඉදි වීම ඇත්තෙන්ම වටිනා කරුණක් බවත් නමුත් මේවා ලබා දීමේදී ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් ඇති කිරීමට ක්‍රියා කළ යුතු බවත් පවසා සිටින ලදී.

(ගරු මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.21)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

මේ සඳහන් කරණු ලබන්නේ පසුගිය කාලයේ නාය යෑමේ අවධානමක් පවතින බව පැවසූ ඉඩම සම්බන්ධයෙන්දැයි විමසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ ඉඩම ලබා දෙන ලෙස පොලිස් දෙපාර්තමේන්තුව විසින් ඉල්ලීමක් කර ඇති බැවින් මේ යෝජනාව ගෙන ආ බවත් ඒ සම්බන්ධයෙන් NBRO වාර්තාවක් ලබා ගෙන සුදුසු නම් පමණක් එම කාර්ය සිදු කරනු ඇති බවත් ඔවුන් විසින් මෙම සභාවෙන් මේ ඉල්ලීම සිදු කර ඇති නිසා අද දින සභාවට ඉදිරිපත් කළ බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

සභාවට අයිති දේපලක් බැවින් මෙය නිකන් ලබා නොදී යම් බදු ක්‍රමයක් යටතේ හෝ සභාවට යම් ආදායමක් ලැබෙන ලෙස ලබා දෙන්නේ නම් සුදුසු බවට තමන් අදහස් කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා:**

මේ වන විට සභා දේපල බොහොමයක් පිටස්තර පුද්ගලයින් විසින් අල්ලා ගන්නා තත්වයකට පත්ව ඇති මොහොතක නීතිය පසිඳලීම සඳහා නගරයකට පොලිස් ස්ථානයක් අත්‍යාවශ්‍ය බැවින් මෙම භූමිය කුලී පදනමකට ලබා දිය හැකි නම් සුදුසු බව පවසා සිටියේය.දැනට දෙහිඕවිට පොලීසිය පවත්වාගෙන යනු ලබන ස්ථානයටත් යම් ගෙවීමක් සිදු කරන බැවින් ඒ ආකාරයට මේ ඉඩම ලබා දිය හැකිද යන්න සම්බන්ධයෙන් සොයා බලන ලෙස පවසා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ ඉඩම සම්බන්ධයෙන් නැවත NBRO වාර්තාවක් ලබා ගත යුතු බවත් එය සභාවට සිදු කිරීම අසීරු බැවින් පොලිස් දෙපාර්තමේන්තුවෙන් එම කාර්ය සිදු කරන්නේ නම් නැවත ඉඩම් කට්ටි කර ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී සභාව දැනුවත් කිරීමට කටයුතු කළ හැකි බැවින් මේ යෝජනාව සඳහා අනුමැතිය ලබා දෙමු යැයි පවසා සිටියේය.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (x) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

තල්දූව පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 08 හි වෙළඳාම් කටයුතු සිදු කරන ලද තල්දූව ගුරුපස්ගොඩ වයි. කුසුමාවතී මහත්මිය අසනීප තත්වයකින් පෙලෙන බැවින් තවදුරටත් එම වෙළඳාම් කටයුතු සිදු කිරීමට නොහැකි බැවින් එහි වෙළඳ අයිතිය ඇගේ ඥාති පුත්‍රයෙකු වන රුවන්වැල්ල ගෝනගල ඉපිලැගල ජනපදයේ පදිංචි එච්.කේ.කීර්ති ශ්‍රී සෝමරත්න නැමති අයට පවරා දෙන ලෙස ඉල්ලීමක් සිදු කර ඇත. පළාත් පාලන කොමසාරිස්ගේ අංක 03/2020 දරණ චක්‍රලේඛයේ 10 වන වගන්තිය ප්‍රකාරව එලෙස කඩ කාමර අතුරු බදු ගෙන ඇති පුද්ගලයින්ට නීතිමය අයිතිය ලබා ගැනීමට අවස්ථාව සලසා ඇති බැවින් එම කඩ කාමරයේ කී මනී මුදල වන රු.660,000.00 ක මුදලින් 25%ක මුදල වන රු.165,000.00 ක ක මුදල අය කර තල්දූව පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 08 හි වෙළඳාම් කටයුතු එච්.කේ.කීර්ති ශ්‍රී සෝමරත්න නැමති අයට පවරාදීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එච්.අමරාවතී මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (xi) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ අංක ACK/5/5 දරණ 2022.01.19 දිනැති ලිපිය මඟින් කොරෝනා මරණ ආදාහනය වෙනුවෙන් ආදාහනාගාර සේවකයන් හට එක් අයෙකුට රු.500.00 බැගින් දීමනාවක් ගෙවීම සම්බන්ධව තොරතුරු විමසා ඇත. එබැවින් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් ඊරියගොල්ල ආදාහනාගාරයේ සිදු කරනු ලබන කොරෝනා මෘත දේහ ආදාහනයේදී එහි සේවය කරනු ලබන අදාහනාගාර ක්‍රියාකරුට සහ සහයක වෙත එක් අයෙකුට රු.500.00 බැගින් කොරෝනා මරණ ආදාහනය වෙනුවෙන් වූ දීමනාවක් ලබා දීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (xii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2022 වර්ෂය සඳහා දෙහිඕවිට ප්‍රාදේශීය සභාව මගින් යන්ත්‍ර සූත්‍ර කුලියට ලබා දීම සඳහා වන ගාස්තු 2021/10/22 දින අංක 2251 දරණ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලදී.එසේ වුවත් ඉන් පසු අවස්ථා කිහිපයකදී සිදු කරන ලද ඉන්ධන ගාස්තු හා ගෑස් මිල වැඩි කිරීම හේතුවෙන් ආදාහනාගාර ගාස්තු සහ යන්ත්‍ර සූත්‍ර කුලියට ලබා දීමේ ගාස්තු පවතින මිල ගණන් යටතේ පවත්වාගෙන යාම දුෂ්කර වී ඇත. ඒ අනුව පහත උපලේඛනයේ II තීරුවේ සඳහන් ආකාරයට ආදාහනාගාරයේ සහ සූත්‍ර කුලියට ලබා දීම සඳහා වන මිල ගණන් 2022 මාර්තු මස 09 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කර අය කිරීම සුදුසු බව යොජනා කරමි.

- **ආදාහනාගාරය සඳහා අය කරනු ලබන ගාස්තු සංශෝධනය**

| | **I තීරුව** | **II තීරුව** |
|---|---|---|
| **ප්‍රදේශය** | **පැවති ගාස්තුව** | **සංශෝධිත ගාස්තුව** |
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | 6,500.00 | 7,500.00 |
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිට පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | 7,500.00 | 8,500.00 |

- **යන්ත්‍ර සූත්‍ර කුලියට ලබා දීම**

| | **I තීරුව** | **II තීරුව** |
|---|---|---|
| **යන්ත්‍ර සූත්‍ර වර්ගය** | **පැවති ගාස්තුව** | **සංශෝධනය වන ගාස්තුව** |
| ටිපර් රථය ( කියුබ් 2 ½) | 12,000.00 දෛනික ගාස්තුව (කි.මී 100 වැඩි වන සෑම කි.මී 1 කට රු 70 බැගින් ඉන්ධන සහිතව) | 14,000.00 දෛනික ගාස්තුව (කි.මී 100 වැඩි වන සෑම කි.මී 1 කට රු 80 බැගින් ඉන්ධන සහිතව) |
| ට්‍රැක්ටරය( සන අඩි 75 ට්‍රේලරය සමග) | රු 3.000.00 (වැඩ කරන පැය 8 ක් ඉන්ධන සහිතව) | රු 6,300.00 (වැඩ කරන පැය 8 ක් ඉන්ධන සහිතව) |
| ගල් රෝල (පැය 4 ට අඩු අවම ගාස්තුව ඉන්ධන සහිතව)<br>පැය 4 ඉක්මවන කාලය සෑම පැයකටම | 12,000.00<br>2,000.00 | 12,000.00<br>2,360.00 |

| | | |
|---|---|---|
| බැකෝ ලෝඩරය | 2,500.00<br>(ඉන්ධන සහිතව මීටර් පැයකට) | 3000.00<br>(ඉන්ධන සහිතව මීටර් පැයකට) |
| ජල බවුසරය(ලීටර් 3000) | 2,500.00 (මීටර පැයකට අතිරේක ගාස්තුව රු 400.00 ඉන්ධන සහිතව) | 3.000.00 (මීටර පැයකට අතිරේක ගාස්තුව රු 400.00 ඉන්ධන සහිතව) |
| ගලි බවුසරය<br>අවසන් බැහැරලීමේ ගාස්තුව | 5,000.00<br>1,500.00<br>(මීටර පැයකට අතිරේක ගාස්තුව රු 400.00 ඉන්ධන සහිතව) | 5,000.00<br>2,000.00<br>(මීටර පැයකට අතිරේක ගාස්තුව රු 400.00 ඉන්ධන සහිතව) |
| තණ කොළ කපන මැෂිම | 500.00 ඉන්ධන රහිතව දිනකට | 500.00 ඉන්ධන රහිතව දිනකට |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී දිස්නා කුමාරි මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (xiii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 122 වන වගන්තියේ (1) වන උප වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 126 වන වගන්තියේ (xiv) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව දෙහිඕවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන මහජනතාවගේ පුද්ගල විනය හා පෞරුෂ වර්ධනය කිරීම, අධ්‍යාපනික සංවර්ධනය, කියවීමේ රුචිකත්වය වැඩි දියුණු කිරීම, විනෝදාත්මක හා නිර්මාණාත්මක අවශ්‍යතා සපුරාලීම සඳහා විවිධ වූ සම්පත් හා සේවා සැපයීම තුළින් මහජන පුස්තකාල සේවාව විධිමත් කිරීම තුළ දෙහිඕවිට ප්‍රාදේශිය සභාව මඟින් ආරම්භ කරන ලද “ විදුනැණ පියස“ විද්‍යුත් පුස්තකාලය මඟින් ආරම්භ කිරීමට නියමිත පුහුණු පාඨමාලාව සහ අදාල මුද්‍රිත පිටපත් ලබා ගැනීම සඳහා අවශ්‍ය ගාස්තු පැනවීමට අදාල ව්‍යාපෘති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීමත්, එමෙන්ම මෙම පුහුණු පාඨමාලාව ආරම්භ කිරීම සඳහා දැරණියගල නැණසල පවත්වාගෙන යනු ලබන එම්.කේ.සම්පත් ප්‍රියංක මහතාගේ සේවය ලබා ගැනීම සුදුසු බවත් යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**(02). ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් මාදොල වසමේ ඇති වසර 40 කට පෙර දැරණියගල ගම් උදාවට සමගාමීව ඉදි කරන ලද මාදොල ප්‍රජා ශාලාව සහිත ගොඩනැඟිල්ල ප්‍රදේශයේ ජනතාවට විශාල ප්‍රයෝජනයක් ඇති ගොඩනැඟිල්ලකි. නමුත් නිසි පරිදි අයිතිය තහවුරු කර ගැනීමට නොහැකි වීම මත මෙම මෙතෙක් කිසිදු සංවර්ධනයක් සිදු කර නොමැත. එබැවින් ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා මෙම ගොඩනැඟිල්ල ප්‍රාදේශීය සභාව සතු කරගෙන නඩත්තු කර පවත්වාගෙන යාම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා:**

මේ ප්‍රජා ශාලාව මීට වසර 35 කට 40 කට පෙර ඉදි කරන ලද බවත් අද වන විට එය දිරාපත්ව වහල කැඩී අබලන් තත්වයට පත්ව ඇති නමුත් මෙය ප්‍රතිසංස්කරණය කිරීමට කිසිවෙකු ඉදිරිපත් නොවන බව පැවසීය. එසේ වීම හේතුව වන්නේ මෙම ඩෙනැඟිල්ලේ අයිතිය කවුරුන් සතුද යන්න මේ වන විට සොයා ගත නොහැකි වීම බව පෙන්වා දුන් එතුමා මේ ප්‍රජා ශාලාව ගමට අත්‍යාවශ්‍ය බවත් අද වන විට

ප්‍රදේශයේ ජන සංඛ්‍යාවේ වර්ධනයත් සමඟ මේ ගොඩනැඟිල්ලේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීමද ගැටළුවක් වී ඇති බව පවසා සිටියේය. ගමට මේ වන විට ග්‍රාම නිලධාරී කාර්යාලයක් , සෞඛ්‍ය සායන පැවැත්වීම සඳහා ස්ථානයක් මෙන්ම සමෘද්ධි හා ආර්ථික සංවර්ධන නිලධාරීන්ට සිය රජකාරි කටයුතු සිදු කිරීම සඳහා කාර්යාලයක් නොමැති බව පැවසූ එතුමා අද වන විට සෞඛ්‍ය සායන කටයුතු මේ ස්ථානයේ ඉතාමත් අසීරුවෙන් පවත්වාගෙන යනු ලබන බව පවසා සිටියේය. එසේම වසර ගණනාවක් පුරාවට මෙම ප්‍රජා ශාලාව මාදොල ප්‍රදේශයේ ඡන්ද මධ්‍යස්ථානයක් ලෙසත් යොදා ගන්නා බව පැවසූ එතුමා දිනෙන් දින සීඝ්‍ර සංවර්ධනයකට ලක් වන මාදොල ප්‍රදේශයට ප්‍රජා ශාලාවක ඇති වැදගත්කම පිළිබඳව සලකා බලා මේ ගොඩනැඟිල්ල ප්‍රාදේශීය සභාව සතු කරගෙන නඩත්තු කර පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය.ෙ

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී යශෝද පද්මසිරි මැතිතුමා:**

ගරු මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා ගෙන ආ යෝජනාව ඉතාමත් කාලෝචිත බවත් මේ ආකාරයෙන්ම අල්ගොඩ ප්‍රදේශයේ ඇති ප්‍රජා ශාලාවේත් අයිතිය තහවුරු කර ගැනීමට නොහැකි වී ඇති බවත් පැවසීය. එම ගොඩනැගිල්ලත් පෙර සඳහන් කළ ආකාරයෙම පැරණි ගොඩනැඟිල්ලක් බවත් කොට්ඨාසයේ රාජ්‍ය නිලධාරීන්ට සිය කාර්යාල කටයුතු පවත්වාගෙන යාම සඳහා ස්ථානයක් නොමැතිව මහත් දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බැවින් ඉදිරියේදී මේ ආකාරයටම අල්ගොඩ ප්‍රජා ශාලාව සම්බන්ධයෙන්ද අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

ආර්.ප්‍රේමදාස මැතිතුමා පළාත් පාලන ඇමති ලෙස කටයුතු කළ කාලයේදී එක් එක් ප්‍රදේශ වල සිදු කරන ලද ව්‍යාපෘති යටතේ දැරණියගල නියෝජනය කරන ලද හිටපු කෘෂිකර්ම නියෝජ්‍ය ඇමති ඒ.කේ.ඩී.වනිගරත්න මැතිතුමා විසින් මාදොල ප්‍රජා ශාලාව ඉදි කළ බව පැවසීය. 01 (xiii) යෝජනාවට අදාලව තමන් අදහස් ප්‍රකාශ කිරීමට නැඟී සිටියත් ඒ අවස්ථාවේදී තමන්ට එය සිදු කළ නොහැකි වූ බව පැවසූ එතුමා විදු නැණ පියස විද්‍යුත් පුස්තකාගය සඳහා පිටතින් දේශකයන් ගෙන්වා ගැනීමට කටයුතු කන්නේ කුමන හේතුවක් නිසාද යන්න විමසා සිටියේය. මෙම සභාවේ අද වන විට අතිරේක කාර්ය මණ්ඩලයක් සිටින්නට තරම් වන නිලධාරීන් හා සේවකයන් දැක ගැනීමට සිටින බවත් ඔවුන් අතර පරිගණක දැනුම ඇති පිරිස්ද සියටින බැවික් ඔවුන් අතරින් අයෙකුට මේ අවස්ථාව ලබා දීම වෙනුවට පිටස්තර අයෙකු ඒ සඳහා යොදවා ගඅනීම තමන් අනුමත නොකරන බව පැවසීය. දැනට මේ සභාවේ සේවය කරනු ලබන ධනුෂ්ක බණ්ඩාර මහතාට ඉතාමත් හොඳ පරිගණක දැනුමක් තිබෙන බව කවුරුත් දන්නා කරුණක් බැවින් එවැනි අයෙකුගේ සේවය ඒ සඳහා යොමු කරන්නේ නම් වටිනා බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පාඨමාලාවක් සිදු කිරීම සඳහා සපුරාගත යුතු යම් යම් වෘත්තීමය සුදුසුකම තිබෙන බැවින් මේ යෝජනාව සඳහා එලෙස පුහුණු ගුරුවරයෙකු නම් කළ බවත් අදාල ව්‍යාපෘති වාර්තාවද මේ සමඟ යොමු කර ඇති බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

අත්දැකීම් සහ උපදෙස් ලබා ගැනීම සඳහා පිටස්තර උපදේශකවරයෙකු සම්බන්ධ කර ගැනීම ගැටළුවක් නොවන බවත් නමුත් එය පවත්වා ගෙන යාම සඳහා සභාවේ සිටින අයගේ සහය ලබා ගැනීම වැදගත් බව පෙන්වා දෙන ලදී.මාදොල ප්‍රජා ශාලාව සභාවට පවරා ගැනීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත් මේවා සභාවට පවරා ගත් පසු නඩත්තු කර පවත්වාගෙන යාමද සභාවේ වගකීමක් බවත් පෙන්වා දෙන ලදී. අද වන විට ඔප්පු මඟින් නීත්‍යානුකූලව සභාවට පවරා දෙනු ලැබූ ඉඩම් සහ ගොඩනැඟිලි තිබෙන බවත් නමුත් ඒවායින් ඇතැම් ඒවා සභාව සතුව පවතිනවාද යන්න ඔවුන්ම නොදන්නා බව පැවසීය 1987 වර්ෂයේ ඔප්පුවක් මඟින් සභාවට පවරා දුන් මල්වරුෂාව ක්‍රීඩා පිටිය සහිත ඉඩමේ පසු කාලයේදී ධානපතියෙකුගේ මාර්ගයෙන් ප්‍රජා ශාලාවක් සඳහා ගෙඩනැඟිල්ලක් ඉදි කළ බවත් පැවසූ එතුමා ඒවාත් අද වන විට නිසි ලෙස නඩත්තු නොවන තත්වයක් තුළ තවත් ගොඩනැගිලි සභාවට පවරා නඩත්තු කිරීම කෙසේ සිදු කළ හැකිදැයි විමසා සිටියේය. එම නිසා නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවට මෙය යොමු කර එහි නිර්දේශ ලබා

ගැනීම පළමුව සිදු කළ යුතු බවත් යෝජනා ඉදිරිපත් කර සම්මත කර ගත් පමණින් මේවායේ නිසි ක්‍රියාත්මක වීමක් සිදු වන්නේද යන්න සිතා බැලිය යුතු බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා:**

අතුල ජයසිරි මැතිතුමා ගෙන ආ යෝජනාව වැදගත් යෝජනාවක් බවත් මේවා ජනතාවගේ සම්පත් බවත් පවසා සිටියේය.සභාව සතු පැරණි සභා ගොඩනගිල්ලත් මෙලෙස ආරක්ෂා කර ගැනීමේ කඩිනම් වැඩපිළිවෙලකට යා යුතු බවට තමන් අදහස් කරන බව පවසා සිටියේය. මේ ආකාරයට කෝටි ගණනක් වියදම් කර සාදන ලද නාපාවල සෞඛ්‍ය මධ්‍යස්ථානය සහිත ගොඩනැගිල්ලත් අද වන විට විනාශ වී යාමේ තර්ජනයට ලක්ව ඇති බව පැවසූ එතුමා එම ගොඩනැගිල්ල තුළ අද වන විට සමාජ විරෝධී ක්‍රියා සිදු වන ස්ථානයක් බවට පත්ව ඇති බව පැවසූ එතුමා මේ ගොඩනැගිල්ල සම්බන්ධයෙක් සොයා බලා සුදුසු පියවරක් ගන්නා ලෙස අවස්ථා කීපයකදී ඉල්ලා සිටි නමුත් අද වන තෙක් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් නොගැනීම කණගාටුවට කරුණක් බව පවසා සිටියේය. එම ප්‍රදේශයට රෝහලක් නොමැති බැවින් නාපාවල සෞඛ්‍ය මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල ග්‍රාමීය රෝහලක් ලෙස සංවර්ධනය කිරීමට හෝ පෙර පාසලක් ආරම්භ කිරීමට හෝ යොදා ගන්නේ නම් වඩාත් සුදුසු බව පෙන්වා දෙන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**03.(i) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

1987 – 2015 තුළ අඛණ්ඩව දෙහිඕවිට ප්‍රාදේශීය සභාව නියෝජනය කළ කෘතහස්ත දේශපාලඥයෙකු වූ කැලැගම නාපාවල ආසනයේ හිටුපු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සම්මුන් ලෙබ්බේ මැතිතුමා 2022.03.04 වෙනි දින අභාවප්‍රාප්ත වූ බැවින් එතුමාගේ අභාවය සම්බන්ධයෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ශෝකය ප්‍රකාශ කිරීම සුදුසු බව යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා:**

අභාවප්‍රාප්ත හිටුපු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සම්මුන් ලෙබ්බේ මැතිතුමා තමන් සමඟ තම කොට්ඨාශයේ වසර 05ක පමණ කාලයක් දේශපාලන කටයුතු වල නිරත වූ බවත් දේශපාලන පක්ෂ දෙකක කටයුතු කළත් සෑම අවස්ථාවකම ඉතාමත් සුහදශීලීව කටයුතු කල බවත් පැවසීය. එතුමා එක් අවස්ථාවක වැඩිම මනාපයෙන් ප්‍රාදේශීය සබාවට තේරී පත් වූ බවත් ඒ මුස්ලිම් ජනතාවගේ ඡන්ද වලින් පමණක් නොවන බවත් පැවසූ එතුමා සියළුම ජාතීන් සමඟ එතුමාගේ තිබූ සුහදත්වය හේතුවෙන් එලෙස වැඩිම මනාප එතුමාට හිමි වූ බවත් පවසා සිටින ලදී. තමන් කුඩා කළ සිටම එතුමන් හඳුනන බවිත එතුමා සැබවින්ම මානවහිතවාදී ජනතා සේවකරයකු බවත් පැවසීය.

(ගරු මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.38)

එතුමාගේ අවමඟුල් අවස්ථාවේ දේශපාලන පක්ෂ භේදයකින් තොරව සියළුම දෙනා සහභාගී වූයේ සම්මුන් ලෙබ්බේ මැතිතුමා තුළ තිබූ මහත්මා ගුණය නිසාවෙන් බව පැවසූ එතුමා මෙම ශෝක ප්‍රකාශ යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වන බව පවසා සිටියේය.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්මුන් ලෙබ්බේ මැතිතුමාගේ අභාවය පිළිබඳව තමන්ද කණගාටු වන බව පැවසීය. එතුමා කිසිදු අවස්ථාවක ජාති භේදයකින් තොරව කටයුතු කළ අයෙකු බවත් සිය සේවාව ලබා දීමේදී කිසිදු අවස්ථාවක තම ජන වර්ගයට මූලිකත්වය ලබා දීමක් සිදු නොකළ බව පැවසීය. තමන් නවක මන්ත්‍රීවරයෙක් වුවත් මෙම සභාවේ ඉතිහාසය පිළිබඳව කතා කිරීමේදී එතුමාගේ සුවිශේෂ ගුණාංග පිලිබඳව නිරන්තරයෙන්ම අසන්නට ලැබෙන බව පවසා සිටියේය. එම නිසා වර්තමාන නවක මන්ත්‍රීවරුන්ට පවා එතුමාගේ චරිතය විශාල ආදර්ශයක් බව පැවසූ එතුමා කැලැගම , නාපාවල ප්‍රදේශ වල ජනතාව අදටත් ගරු මන්ත්‍රී සම්මුන්ලෙබ්බේ මැතිතුමා පිළිබඳව ඉමහත්

ගෞරවයෙන් කතා කරන බව පැවසීය. බෞද්ධයෙකු වශයෙන් තමන්ද එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරන බව පවසා සිටියේය.

**ගරු මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා:**

තමන් දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන කාලයේදී අභාවප්‍රාප්ත ගරු මන්ත්‍රී සම්මුන්ලෙබ්බේ මැතිතුමා සමඟ සමීපයෙන් ආශ්‍රය කිරීමට ලැබුණු බවත් එතුමාගේ අභාවය පිළිබඳව මේ අවස්ථාවේදී තමන්ද ශෝකය ප්‍රකාශ කරන බව පවසා සිටියේය.අප දේශපාලනයට ඒමටත් පෙර සිටම වාමාංශික දේශපාලනයේ නිරත වූ බව පැවසීය.නාපාවල ප්‍රදේශය නියෝජනය කරමින් එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරු කීපදෙනෙකු සිටි බවත් නමුත් සම්මුන්ලෙබ්බේ මැතිතුමා කැලෑගම නාපාවල ගුරුගල්ල ප්‍රදේශ වලට විශාල සේවයක් සිදු කළ බව පැවසීය. එතුමාගේ අභාවයෙන් සිදු වූ හිඩැස පිරිමැහීමට කිසිවෙකුටත් නොහැකි බව පැවසූ එතුමා දීර්ඝ කාලයක් මේ සභාව නියෝජනය කළ කීර්තිමත් දේශපාලඥයෙකු ලෙස ගරු මන්ත්‍රී සම්මුන්ලෙබ්බේ මැතිතමා හැඳින්වීමට හැකි බව පවසා සිටියේය. මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු විශාල පිරිසක් සිටින බවත් ඔවුන් තම ජනතා සේවය තම ගම් ප්‍රදේශ වලට මෙන්ම මේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පුරාවට සිදු කළත් සභාවක් ලෙස මොවුන් සිදු කරන ලද සේවාවට ඔවුන්ගේ අවසන් මොහොතේදී හෝ මීට වඩා ගෞරවයක් ලබා දිය යුතු බවට තමන් අදහස් කරන බව පැවසීය.අද වන විටත් මේ සභාව ආරම්භයේ සිට අඛණ්ඩව සභාව නියෝජනය කරන ලබන මන්ත්‍රීවරු සිටින බවත් ඔවුන්ගේ සුබසාධනය වෙනුවෙන් ඉදිරියේදී යම් වැඩපිළිවෙලක් සූදානම් කරන්නේ නම් වඩාත් යෝග්‍ය බව පවසා සිටියේය. අඩු තරමින් ඔවුන් මිය ගිය අවස්ථා වලදී සිය පවුලේ ඥාතීන්ට හෝ මන්ත්‍රීවරයෙක් ලෙස ඔවුන් ජීවත්ව සිටියදී සිදු කළ සේවාව යම් ලෙසකින් ඇගයීමක් සිදු වුවාය යන සැනසීම හිමි කර දීම සභාවක් ලෙස අපගේ වගකීම බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. අබේසේන මැතිතුමා:**

ගරු මන්ත්‍රී සම්මුන්ලෙබ්බේ මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් තමන් ඉතාමත් කණගාටුවට පත් වූ බවත් එවැනි දක්ෂ දේශපාලන නායකයෙකු අහිමි වීම විශාල පාඩුවක් බවත් පවසා සිටියේය. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත ක්‍රියාත්මක වීම ආරම්භ කළ අවස්ථාවේ සිට දේශපාලන ජීවිතය තුළ හා ප්‍රාදේශීය සභා ජීවිතය තුළ ඒ කාර්යන් කුමන ආකාරයෙන් පවත්වාගෙන යා යුතුද යන්න පිළිබඳව මනා අවබෝධයකින් ක්‍රියා කළ මහජන නියෝජිතයෙකු ලෙස අභාවප්‍රාප්ත ගරු මන්ත්‍රී සම්මුන්ලෙබ්බේ මැතිතුමා හඳුන්වා දිය හැකි බව පැවසීය. මේ සභාව තුළ නොයෙකුත් ප්‍රශ්න ගැටළු උද්ගත වූ අවස්ථාවලදී තමන් සිටිය යුතු ස්ථාවරය පිළිබඳව පැහැදිලි අවබෝධයකින් යුතු ක්‍රියා කළ එතුමා සෑම අවස්ථාවකදීම සත්‍ය වෙනුවෙන් හා සභාවේ ගෞරවය වෙනුවෙන් පෙනී සිටි චරිතයක් බව පවසා සිටියේය. එතුමාගේ එම අමිල සේවය හේතුවෙන් දෙහිඕවිට ප්‍රාදේශීය සභාව තුළ එතුමාගේ නම කිසිදු දිනක අමතක කළ නොහැකි බවත් පවසා සිටින ලදී. එසේ වුවත් පසු ගිය කල වලදී වරින් වර බලයට පතු වූ රජයන් වලින් ඇතම් අවස්ථා වල එතුමාට අසාධාරණ සිදු වූ බවත් එක් අවස්ථාවක එතුමාට ඒ හේතුවෙන් සිරගත වීමට පවා සිදු වූ බවත් සිහිපත් කළ එතුමා පසු කාලීනව එයින් නිදහස ලැබූ අනිකුත් පුද්ගලයන්ට වන්දි පවා හිමි වුවත් ගරු මන්ත්‍රී සම්මුන්ලෙබ්බේ මැතිතුමාට එයද අහිමි වූ බව පසිහිපත් කර සිටියේය. අවසන මොහෙතෙ දක්වාම ඒ වෙනුවෙන් එතුමා සටන් කළ බවත් නමුත් ඒ අසාධාරණයට සාධාරණයක් එතුමා වෙනුවෙන් සිදු නොවීම පිළිබඳව එතුමාගේ සමකාලීන දේශපාලන සභයෙකු ලෙස තමන් අතිශයින් කණගාටු වන බව පවසා සිටියේය. එතුමාගේ අභාවය සම්බන්ධයෙන් තමන් මහත් සේ කණගාටු වන අතර එතුමාට නිවන් සුව ලැබේවායි ප්‍රාර්ථනා කරන බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

අභාවප්‍රාප්ත හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්මුන්ලෙබ්බේ මැතිතුමාගේ අභාවය පිළිබඳව ඉතාමත් කණගාටු වන බව පැවසීය. තමන් මුල් කාලයේ දේශපාලනයට යොමු වන විටත් ගරු මන්ත්‍රී සම්මුනලෙබ්බේ මැතිතුමා වාමාංශික දේශපාලනයේ නිරත වූ බවත් ඒ කාලයේදී තමන් ඇතුළු නවක මන්ත්‍රීවරුන්ට සභා පනත් හා නීති රීති සම්බන්ධයෙන් අවබෝධයක් නොතිබූ බවත් නමුත් ගරු මන්ත්‍රී සම්මුන්ලෙබ්බේ මැතිතුමාට ඒ කටයුතු සම්බන්ධයෙන් පුදුමාකාර අවබෝධයක් තිබූ බවත් පසා සිටියේය. එතුමා ඉතාමත් පරිනත දේශපාලන නායකයෙකු බවත් ප්‍රශ්න විසඳීමේ පුදුමාකාර

හැකියාවක් තිබූ බවත් පැවසීය. සැම විටම දේශපාලනයෙන් අයුතු එල ප්‍රයෝජන ලබා නොගත් නිසාම ආර්ථික වශයෙන් අදුරු තලයක එතුමා සිටියත් ජනතාව වෙනුවෙන් විශාල සේවාවක් සිදු කළ බව පෙන්වා දෙන ලදී. එතුමා අඛණ්ඩව මේ සභාව නියෝජනය කළ බවත් කාලක් රෝගාතුරව සිට අභාවප්‍රාප්ත වූ එතුමාගේ අභාවය සම්බ්නධයෙන් එතුමා සමඟ දේශපාලන කටයුතු වල නිරත වූ මන්ත්‍රීවරයෙක් ලෙස තමන්ද ඉතාමත් කණගාටු වන පව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා:**

අභාවප්‍රාප්ත සම්මුන්ලෙබ්බේ මැතිතුමා ඉවසීමේ ගුණය මනාව ප්‍රගුණ කළ නායකයෙක් බව පැවසීය. තම පියාගේ වැඩිමහල් සහෝදරයා වූ හිටපු මන්ත්‍රී එච්.ආර්.මිත්‍රපාල මැතිතුමා සමඟ දේශපාලනය කරන අවධියේ සිට තමන් සම්මුන්ලෙබ්බේ මැතිතුමා තුළින් ඒ ගුණාංගය දුටු බව පැවසීය. දේශපාලනයේදී ජාති ආගම් භේද පසෙකලා සැමට සමානව සැලකීමේ ගුණාංගය එතුමා තුළින් තමන් කුඩා කැලයේ සිටම දුටු බවත් පසුගිය කාලයේ අසනීප තත්වයෙන් පත් වූ අවස්ථාවේ එතුමා වෙනුවෙන් රෝද පුටුවක් ලබා දීමට තමන් මුල් වී ක්‍රියා කරමින් සිටින අවස්ථාවක එතුමාගේ මෙම හදිසි මරණය සිදු වූ බව පැවසීය. ගරු මන්ත්‍රී සම්මුන්ලෙබ්බේ මැතිතුමාගේ අභාවය සම්බන්ධව තමන්ගේ ශෝකය එතුමාගේ පවුලේ සියළුම ඥාතීන වෙත පුදකරන බව පවසා සිටින ලදී.

(ගරු මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 11.00)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

1991 සභාව ස්ථාපිත කල අවධියේ සිට සිටි පක්ෂ විපක්ෂ සියළුම දේශපාලන නියෝජිතයන්ගේ අදට වඩා හොඳ විනයක් සහ අන් අයගේ මතයට ඇහුම්කන් දීමේ ගුණය පැවති බවත් ඒ කාලයේ සිට මෙම සභාව නියෝජනය කළ තවත් එක් විශිෂ්ඨ දේශපාලන සහෘදයෙකු ලෙස අභාවප්‍රාප්ත සම්මුන්ලෙබ්බේ මැතිතුමා හැදින්වීමට හැකි බවත් පවසා සිටියේය.පළමු ප්‍රාදේශීය සභාවට මන්ත්‍රීන්වරු පත් වන විට ආණ්ඩු පක්ෂයට මන්ත්‍රී ආසන 12ක සහ විපක්ෂයට ආසන 07 ක් හිමිව තිබූ බවත් ඒ කාලයේදී ඉතාමත් ප්‍රගතිශීලී නායකයින් සිටි බ පැවසීය.ලංකා සමසමාජ පක්ෂය , එක්සත් ජාතික පක්ෂය ශ්‍රීලංකා නිදහස් පක්ෂය නියෝජනය කළ බොහොමයක් දේශපාලන නායකයන් වෛද්‍යවරු, ගුරුවරු මෙන්ම උපාධිධාරී උගත් පිරික් බව සිහිපත් කළ එතුමා 1997 වර්ෂයේදී සම්මුන්ලෙබ්බේ මැතිතුමා බල ප්‍රදේශයේ වැඩම මනාප ලබමින් මෙම සභාවට තේරී පත් වූ බව පැවසූ එතුමා එවකට පැවති සන්ධාන රජයෙන් සුළු ජාතිකයෙකු වීම හේතුවෙන් එතුමාට සභාපති ධූරය ලබා නොදීම කණගාටුවට කරුණ් බව පැවසීය. එම අවස්ථාවේ ඒ අසාධාරණයට විරුද්ධව තමන් සභාවේදී ප්‍රශ්න කළ බවත් සියළු බාධක හමුවේ වුවත් සම්මුන්ලෙබ්බේ මැතිතුමා සැමවිටම සත්‍ය වෙනුවෙන් පෙනී සිටි බවත් පැවසීය.

(ගරු මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුම් , ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා සහ ගරු මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.01)

පුළුල් බුද්ධියකින් කටයුතු කරන අතලොස්ක් වූ දේශපාලන නායකයන් අතර සම්මුන්ලෙබ්බේ මැතිතුමා ප්‍රමුඛස්ථානයක සිටි බවත් එතුමා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කළ අවධියේදී එත්මාට ලැබීමට නියමිතව තිබූ හිඟ මුදලක් ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට පසුගිය යහපාලන රජය සමයේ අප විසින් උත්සාහ කළ බවත් එවැනි කාර්යන් සඳහා කිසිදු අවස්ථාවක එතතුමා දරන ලද දේශපාලන මතය අදාල කර නොගත් බවත් පවසා සිටියේය. නිසා ප්‍රගතිශීලී විද්වත් දේශපාලන නායකයෙකුගේ අභාවය සම්බන්ධයෙන් තම ශෝකය ප්‍රකාශ කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා:**

හිටපු විපක්ෂ නායක සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා ප්‍රකාශ කළ පරිදි අභාවප්‍රාප්ත සම්මුන්ලෙබ්බේ මැතිතුමා ඉතාමත් ඍජු තීරණ ගනු ලැබූ නායකයෙක් බවත් සැම විටම අසාධාරණයට එරෙහිව ක්‍රියා කළ බවත් පවසා සිටියේය.එතුමා මෙන්ම ඍජු තීරණ ගත් මේ සභාව නියෝජනය කළ තවත් එක් නායකයෙක් ලෙස අපවත් වී වදාළ පඤ්ඤාවංශ ස්වාමීන් වහන්සේ හඳුන්වා දිය හැකි බවත් මෙවැනි විරල ගණයේ දේශපාලන නායකයන්ගේ අභාවය ප්‍රදේශයට විශාල පාඩුවක් බවත් එතුමාගේ අභාවය

පිළිබඳව තම ශෝකය මේ අවස්ථාවේ ප්‍රකාශ කරමින් එතුමාට නිවන්සුව අත්වේවායි ප්‍රාර්ථනා කරන බව පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා:**

1991 වර්ෂයේ සිටම දෙහිඅිවිට ප්‍රාදේශීය සභාව පිළිබඳව කතා කිරීමේදී අභාවප්‍රාප්ත ගරු මන්ත්‍රී සම්මුන්ලෙබ්බේ මැතිතුමා කැපී පෙනෙන චරිතයක් බව පැවසීය. එතුමා ප්‍රදේශයේසංවර්ධන කටයුතු වලදී සුවිශාල දායකත්වයක් ලබා දුන් චරිතයක් බවත් මාදොල ප්‍රදේශයේ ජනතාවත් එතුමාට වැඩිම මනාප ලබා ගැනීම සඳහා ජාති ආගම් භේදයකින් තොරව සයහය ලබා දුන් බව පැවසීය. සම්මුන්ලෙබ්බේ මැතිතුම මානුෂීය ගුණාංගවලින් ඉහල පුද්ගලයෙකු නිසා මිනිසුන් සෑම අවස්ථාවකදීම එතුමාට ආදරය කළ බව පැවසූ එතුමා එතුමාගේ අවසන් කටයුතු සිදු කරන අවස්ථාවට තමන්ට සහභාගී වීමට නොහැකි වුවත් අභාවය සම්බන්ධයෙන් තම ශෝකය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පවසා සිටියේය. එසේම ශ්‍රී දළදා මාළිගාවේ දන්ත ධාතූන්වහන්සේ වැඩම වූ නැඳුන්ගමුවේ රාජා හස්තියා ඊයේ දිනයේ මිය ගිය බවත් එයත් කනගාටුවට කරුණක් බැවින් වචනයක් හෝ ප්‍රකාශ කිරීම අපගේ වගකීමක් බව පැවසීය. එම සත්වයා දෙස් විදෙස් ජනතාවගේ ගෞරවයට පාත්‍ර වූ හස්ති රාජයෙකු බැවින් සහ බෞද්ධ සාසනය වෙනුවෙන් සිදු කළ මෙහෙවර උදෙසා සමස්ථ ජාතියේ ගෞරවයට බඳුන් වන සත්වයෙක් බවට පත්වී ඇති බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා:**

හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්මුන්ලෙබ්බේ මැතිතුමාගේ අභාවට සම්බන්ධයෙන් තමන්ද කණගාටු වන බව පැවසීය. වසරක් වැනි කෙටි කාලයක් තමන්ටද එතුමාව සමීපව ඇසුරු කිරීමට ලැබුණු බවත් ඒ සෑම අවස්ථාවකදීම එතුමාගේ අතේ ලියකිවිලි රැසක් සහිත විශාල ෆයිල් කවරයක් තිබූ බැවින් ඒ සම්බන්දයෙන් විමසීමේදී අධ්‍යාපන දෙපාර්තමේන්තුවට සම්බන්ධව සේවය කරන කාලටයදී එතුමාට ලැබීමට නියමිත වන්දි මුදලක් ලබා ගැනීමට උත්සාහ දරමින් සිටි බව දැන ගැනීමට ලැබුණු බව පැවසීය. එය මුදලින් රුපියල් ලක්ෂ 25 කට 30 කට ආසන්න මුදලක් බව පැවසූ එතුමා ඇතැම් විට සම්මුන්ලෙබ්බේ මැතිතුමාගේ පුතණුවන් හෝ දේශපාලනයට පැමිණ සිටියා නම් එය ඉතාමත් පහසුවෙන් ලබා ගැනීමට හැකි වනු ඇති බව පවසා සිටියේය. මේ ආකාරයටම කිසිදු සාධාරණයක් සිදු නොවී ජීවිතයේ අවසානභාගය ශෝකී අයුරින් ගත කර අපවත් වීමට තල්දූවේ පඤ්ඤාවංශ ස්වාමීන් වහන්සේට මෙන්ම පසුගියදා අභාවප්‍රාප්ත වූ සම්මුන් ලෙබ්බේ මැතිතුමාටත් සිදු වූ බැවින් ඉදිරියේදී හෝ මහජන නියෝජිතයන්ට මෙවැනි සිදු වීම් සිදු නොවීමට වගබලා ගැනීම මේ සභාවේත වගකීමක් බව පවසා සිටින ලදී. එබැවින් විශ්‍රාම ලබා ගන්නා හෝ ධුරයෙන් ඉවත වූ මන්ත්‍රීවරුන්ගේ සුබසාධනය සම්බන්ධයෙන් යම් කඩානම් වැඩපිළිවෙලක් මේ සභා වාරයේදී හෝ ක්‍රියාත්මක කර පවත්වාගෙන යාම වඩාත් කාලෝචිත බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

ගරු මන්ත්‍රී සම්මුන්ලෙබ්බේ මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් තමන්ද ශෝක වන බව පැවසීය. ජීවතුන් අතර සිටියදී තමන්ටද එතුමාගේ අවසාන කාලයේදී එතුමාව ආශ්‍රය කිරීමට ලැබුණු බවත් එතුමා ප්‍රකාශ කළ ආකාරයට යම් යම් අසාධාරණකම් නොයෙකුත් පාර්ශවයන්ගෙන් එතුමාට සිදු වී ඇති බවත් පැවසීය. පුද්ගලයෙකු ජීවත්ව සිටියදී ඔහු වෙනුවෙන් හෝ ඔහුගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් සිදු විය යුතු වගකීම් හා යුතුකම් නිසි ලෙස සිදු නොකර ඒ පුද්ගලයා මිය ගිය පු කොතරම් ඒ තැනැත්තාගේ ගුණ වර්ණනා කළත් එහි ඵලක් නොවන බව පැවසූ එතුමා අඩු තරමින් එතුමා වෙනුවෙන් සභාවේ මන්ත්‍රීවරු ශෝක ප්‍රකාශයක් සිදු කළ බව හෝ එතුමාගේ පවුලේ උදවිය වෙත ලිඛිතව දන්වා යවන ලෙස ඉල්ලා සිටියේය. දේශපානික වශයෙන් එතුමාගේ අවශ්‍යතා වෙනුවෙන් සහයක් ලබා දීමට නොහැකි වුවත් අඩුතරමින් තම සැමියගේ, පියාගේ අභාවය වෙනුවෙන් ඔහු වැඩි කාලයක් සේවය කළ ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රීවරු විසින් ශෝක ප්‍රකාශ යෝජනාවක් සභා සම්මත කර ඇති බවට එතුමාගේ පවුලේ ඥාතීන් දැනගනු ඇතැයි පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.16)

**ගරු සභාපති ඒ.ජී.දම්මික ශ්‍යාමින්ද මැතිතුමා:**

ශ්‍රීලංකා සමසමාජ පක්ෂයෙන් ක්‍රියාකාරී දේශපාලනයට පිවිසි ගරු මන්ත්‍රී සම්මුන්ලෙබ්බෙ මැතිතුමා සංහිඳියාව නියෝජනය කළ විරල ගණයේ දේශපාලන නායකයෙකු බව පැවසීය. තමන් මුල් වරට මන්ත්‍රීවරයෙක් ලෙස මේ සභාවට තේරී පත්වී පැමිණෙන විට ඉතාමත් ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙකු වූ එතුමා එවකට කාර්මික හා සේවා කාරක සභාවේ සභාපතිවරයා ලෙස ක්‍රියා කළ බව සිහිපත් කර සිටියේය. දේශපාලනික වශයෙන් එතුමාගේ තිබූ ඥානය මෙන්ම ජාතීන් අතර සුහදත්වය ගොඩනැංවීම සඳහා තිබූ නිහතමානී ගුණාංග හේතුවෙන්ම ජාති ආගම් භේදයකින් තොරව සියළු දෙනා අතර ඉමහත් ජනප්‍රියත්වයක් ලබා ගැනීමට ගරු මන්ත්‍රී සම්මුන්ලෙබ්බෙ මැතිතුමාට හැකි වූ බව පැවසීය. එතුමා රෝගාතුරව සිටි අවස්ථාවේදී තමන් ගරු මන්ත්‍රී ඩබ්. අබේසේන මැතිතුමා සමඟ එතුමාගේ නිවසට ගොස් දුක සැප සොයා බැලූ බවත් ඒ වනවිට එතුමාට රෝද පුටුවක අවශ්‍යතාවයක් ඇති බව පැවසූ නිසා ඒ සම්බන්ධයෙන් අදාල කටයුතු සිදු කරමින් පවතින අවස්ථාවේ එතුමා ඒ වන විට රෝද පුටුවක සිටීමට නොහැකි තත්වයක සිටි බැවින් යම් සුවයක් ලද පසු එය ලබා ගැනීම ප්‍රමාණවත් බැවින් ඉදිරියේදී ඒ බව දැනුම් දෙන බවට එතුමාගේ පුතා විසින් දන්වා සිටි බවත් පවසන ලදී. පසුව අවස්ථාවක අප විසින් එම රෝද පුටුව එම නිවසට ගෙන ගොස් භාර දුන් බව පැවසූ එතුමා තල්දූව ඇපලපිටිය,සමරුගම,නාපාවල ආදී ප්‍රදේශ වලට ගරු මන්ත්‍රී සම්මුන්ලෙබ්බෙ මැතිතුමාගෙන් සුවිශාල සේවයක් සිදු වූ බව පවසා සිටියේය.රටේ ජාතික ප්‍රශ්න වලදී ජාතීන් අතර සංහිඳියාව පවත්වාගෙන යාම සඳහා එතුමා විසින් සුවිශාල මෙහෙවරක් සිදු කළ බවත් සිහිපත් කර සිටියේය. එතුමාගෙන් සිදු වූ නිහඬ මෙහෙවරට ගරු කිරීමක් වශයෙන් මේ ශෝක ප්‍රකාශ යෝජනාව සභාවට ඉදිරිපත් කළ බවත් මේ සම්බන්ධයෙන් එතුමාගේ පවුලේ ඥාතීන් වෙත ලිඛිතව දන්වා යැවීමට කටයුතු කරමුයැයි පවසා සිටින ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**03.(ii) ගරු සභාපති ඒ.ජී.දම්මික ශ්‍යාමින්ද මැතිතුමා:**

පහත සඳහන් කර්මාන්තය ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලින් ප්‍රතිපාදන වෙන් කර ක්‍රියාත්මක කිරීමටත් ඒ සඳහා වන වියදම සභා අරමුදලින් දැරීමත් සුදුසු බව යෝජනා කරමි.

- කඹුරාපොල උඩුවිල මාර්ගය ආරම්භයේ මාර්ගයට අවහිර ලෙස වැටී ඇති ගල කඩා ඉවත් කිරීම - රු. 48,500.00

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා සලකා බැලීම හා වෙනත් දිනයක් නියම කිරීම:**

2022.02.22 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව , 2022.02.08 හා 2022.02.23 දින වල පැවති ප්‍රසම්පාදන කාරක සභා වාර්තා, 2022.02.25 පැවති කාර්මික හි සේවා කාරක සභා වාර්තාව ,2022.02.25 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බලන ලදී.

(උ) 2022 ජනවාරි මාසයට අදාල එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව (ඇමුණුම 07) හා වියදම් විස්තරය (ඇමුණුම 08) සලකා බැලීම.

ආදායම් ප්‍රගති වාර්තාව - 2022 පෙබරවාරි මාසය

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

ඇමුණුම 07

| අනු අංකය | (I) ආදායම් විෂය | (II) අය ශීර්ෂය | හිඟ ආදායම | | | | | | ඇස්තමේන්තුගත ආදායම | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | (III) 2022.01.01 දිනට ශේෂය රු. | (IV) පසුගිය මාසය දක්වා එකතු කළ ආදායම් රු. | (V) ප්‍රවර්තන මාසය තුළ එකතුකළ ආදායම | (VI) මුළු එකතුව රු. | (VII) ප්‍රතිශතය % | (VIII) තව දුරටත් පවත්නා හිඟය (III) - (VI) | (IX) 2021 අයවැය ඇස්තමේන්තුව රු. | (X) පසුගිය මාසය දක්වා එකතු කළ ආදායම් රු. | (XI) ප්‍රවර්තන මාසය තුළ එකතුකළ ආදායම | (XII) මුළු එකතුව රු. | (XIII) ප්‍රතිශතය % | (XIV) වර්ෂයේ ලැබිම වලින් හිඟය රු. (IX)-(XII) |
| 01. | වරිපනම් බදු | 1.11 | 2,034,397 | 93,065 | 62,010 | 155,075 | 8% | 1,879,321 | 3,038,000 | 717,251 | 222,547 | 939,799 | 31% | 2,098,201 |
| 02. | අක්කර බදු | 1.12 | 2,111,057 | 14,456 | 22,331 | 36,787 | 2% | 2,074,270 | 150,000 | 1,178 | 1,590 | 2,768 | 2% | 147,232 |
| 03. | දැන්වීම් පුවරු ගාස්තු | 1.36 | - | - | | - | 0% | - | 125,000 | - | 2,200 | 2,200 | 2% | 122,800 |
| 04. | වෙළඳ බලපත්‍ර ගාස්තු | 2.31 | - | - | | - | 0% | - | 260,000 | 25,250 | 47,123 | 72,373 | 28% | 187,627 |
| 05.I | කර්මාන්ත බදු | 2.16.1 | - | - | | - | | - | 680,000 | 78,500 | 93,000 | 171,500 | 25% | 508,500 |
| 05.II | ව්‍යාපාර බදු | 2.16.2 | - | - | | - | 0% | - | 430,000 | 63,000 | 96,000 | 159,000 | 37% | 271,000 |
| 06. | පාරිසරික බලපත්‍ර ගාස්තු | 2.36 | - | - | | - | 0% | - | 120,000 | 8,000 | - | 8,000 | 7% | 112,000 |
| 07. | කොම්පෝස්ට් පොහොර /අබලි ද්‍රව්‍ය විකුණුම් | 2.62.2 | - | - | | - | 0% | - | 800,000 | 20,250 | 53,127 | 73,377 | 9% | 726,623 |
| 08. | ඉඩම් විකිණීම මත 1% බද්ද | 3.18 | - | - | | - | 0% | - | 150,000 | 48,430 | - | 48,430 | 32% | 101,570 |
| 09. | පොදු වෙළඳ සංකීර්ණ කඩ කුලී | 3.22.2<br>3.22.3 | 1,478,827 | 142,500 | 8,000 | 150,500 | 10% | 1,328,327 | 1,935,000 | 62,000 | 51,500 | 113,500 | 6% | 1,821,500 |
| 10. | අනෙකුත් කඩ කාමර කුලී | 3.22.1<br>5.22 | 32,028 | - | 675 | 675 | 2% | 31,353 | 169,800 | 15,000 | 10,000 | 25,000 | 15% | 144,800 |
| 11. | ඉඩම් වල එළදාව බදු දීම | 3.24 | - | - | - | - | 0% | - | 7,600 | - | - | - | 0% | 7,600 |
| 12. | යන්ත්‍රෝපකරණ කුලියට දීම | 3.25.1 | - | - | - | - | 0% | - | 1,500,000 | 36,640 | 30,000 | 66,640 | 4% | 1,433,360 |
| 13. | නගර ශාලා/ ප්‍රජා ශාලා | 3.25.3 | - | - | - | - | 0% | - | 500,000 | - | 40,000 | 40,000 | 8% | 460,000 |
| 14. | භූමිය කුලියට දීම/ වාහන නැවතුම් ගාස්තු | 3.43.2 | - | - | - | - | 0% | - | 50,000 | 11,333 | 10,500 | 21,833 | 44% | 28,168 |
| 15. | සතිපොළ ආදායම් | 5.23.1 | 196,250 | - | - | - | 0% | 196,250 | 1,894,000 | 141,840 | 128,350 | 270,190 | 14% | 1,623,810 |
| 16. | මස් කඩ හා මාළු කඩ කුලී | 5.23.2 | 3,450,256 | - | - | - | 0% | 3,450,256 | 6,867,000 | 610,318 | 610,318 | 1,220,635 | 18% | 5,646,365 |
| 17. | ආදාහනාගාර ගාස්තු | 5.43.1 | - | - | - | - | 0% | - | 2,000,000 | 200,500 | 285,000 | 485,500 | 24% | 1,514,500 |
| 18. | විනෝද බදු | 6.15 | - | - | - | - | 0% | - | 25,000 | 87,500 | - | 87,500 | 350% | (62,500) |
| 19. | වෙනත් ආදායම් (මාකට් කඩ, මස් මාළු කඩ, සති පොළ දඩ) | 5.51.1<br>3.51.1<br>5.51.2 | 231,080 | 12,525 | 868 | 13,393 | 6% | 217,688 | 101,000 | 1,200 | 650 | 1,850 | 2% | 99,150 |
| | එකතුව | | 9,533,895 | 262,546 | 93,884 | 356,430 | 4% | 9,177,465 | 20,802,400 | 2,128,189 | 1,681,905 | 3,810,094 | 18% | 16,992,306 |
| 20. | මුද්දර ගාස්තු | 1.63 | 21,509,330 | - | - | - | 0% | 21,509,330 | 20,000,000 | | - | - | 0% | 20,000,000 |
| 21. | උසාවි දඩ | 1.52 | 4,722,034 | - | - | - | 0% | 4,722,034 | 5,000,000 | | - | - | 0% | 5,000,000 |

ඇමුණුම:- 08

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

## 2022 පෙබරවාරි මාසය සඳහා ආදායම් හා වියදම් විස්තරය

**(01)** ආදායම් විස්තරය .

| අය ශීර්ෂය | ආදායම් විස්තරය | මුදල (රු) | |
|---|---|---|---|
| | පුනරාවර්ථන ආදායම් | | |
| 10 | වරිපනම් හා බදු | 497,478.54 | |
| 20 | කුලී | 925,375.83 | |
| 30 | බලපත්‍ර ගාස්තු | 49,323.00 | |
| 40 | සේවා සඳහා ගාස්තු | 411,456.99 | |
| 50 | වරෙන්තු ගාස්තු හා දඩ | 6,399.16 | |
| 60 | වෙනත් ආදායම් | 93,370.14 | |
| 70 | ආදායම් ආධාර | 4,077,893.93 | |
| | පුනරාවර්ථන ආදායම් එකතුව | | 6,061,297.59 |
| 80 | ප්‍රාග්ධන ආදායම් | | 20,000.00 |
| | පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් එකතුව | | **6,081,297.59** |
| | වෙනත් ආදායම් | | |
| | විවිධ ණය ගැතියෝ (කර්මාන්ත) | - | |
| | ගිවිසුම් ඇප තැන්පත් | - | |
| | ස්ථාවර තැන්පත් නිදහස් කිරීම | - | |
| | සේවක ණය | 187,883.50 | |
| | අත්තිකාරම් | 26,176.26 | |
| | මුද්දර බදු තැන්පත් | 15,000.00 | |
| | ටෙන්ඩර් තැන්පත් | 5,000.00 | |
| | ගිණුම් අතර මුදල් මාරු කිරීම | - | |
| | මිශ්‍ර තැන්පත් | 188,000.00 | |
| | වෙනත් ආදායම් එකතුව | | 422,059.76 |
| | මුළු ආදායම් එකතුව | | **6,503,357.35** |

**(02)** වියදම් විස්තරය

| වැය ශීර්ෂය | වියදම් විස්තරය | මුදල (රු) | |
|---|---|---|---|
| | පුනරාවර්ථන වියදම් | | |
| 1 | වැටුප් හා වේතන | 4,660,923.72 | |
| 2 | ගමන් වියදම් | 26,685.00 | |
| 3 | සැපයුම් හා උපකරණ | 716,731.45 | |
| 4 | ප්‍රා.ව. අ.වැ. හා නඩත්තු | 383,935.00 | |
| 5 | ප්‍ර.සම්, ආවශ්‍යක හා වෙනත් සේවා | 342,068.31 | |
| 6 | පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 101,327.47 | |
| 7 | ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | - | |
| 8 | විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ | 66,421.99 | |
| | පුනරාවර්තන වියදම් එකතුව | | **6,298,092.94** |
| | ප්‍රාග්ධන වියදම් | | |
| 9 | ප්‍රාග්ධන / උපකරණ වැය | 119,590.00 | |
| 10 | ණය ආපසු ගෙවීම් | 210,945.15 | |
| | ප්‍රාග්ධන වියදම් එකතුව | | **330,535.15** |
| | පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම් එකතුව | | **6,628,628.09** |
| | වෙනත් වියදම් | | |
| | සේවක ණය | 375,000.00 | |
| | අත්තිකාරම් | 106,073.09 | |
| | මිශ්‍ර තැන්පත් | 45,833.00 | |
| | ණය හිමියෝ | 255,272.79 | |
| | ගිණුම් අතර මුදල් මාරු කිරීම | - | |
| | මුද්දර බදු තැන්පත් | - | |
| | ගෙවිය යුතු එකතු කල අගය මත බදු | - | |
| | වෙනත් වියදම් එකතුව | | 782,178.88 |
| | මුළු වියදම් එකතුව | | **7,410,806.97** |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා:**

කාර්මික හා සේවා කාරක සභාවේ 02 වන කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටියේය. දෙහිඕවිට බස් නැවතුම්පළේ කොටසක් ගාමිණී නැමති පුද්ගලයෙකු විසින් අනවසර ඉදි කිරීමක් සිදු කර ඇති බවත් එහි මායිම් ගල් ඉවත් කිරීමට කටයුතු කර ඇති බවත් පැවසූ එතුමා මේ සම්බන්ධයෙන් ලේකම්තුමාට දැනුම් දුන් බවත් පවසා සිටියේය.එම ස්ථානය කාර්මික නිලදාරිවරයෙකු යොමු කර පරීක්ෂා කරන ලෙසත් සභාවට අයිතියක් තිබෙන තවත් මෙවැනි දේපල බොහොමයක් තිබෙන බවත් ඒවා ආරක්ෂා කර ගැනීම අපගේ වගකීමක් බවත් පවසා සිටියේය. එසේම කාලයක් තිස්සේ මේ ප්‍රදේශයේ ජනතාව ස්නානය කිරීම සඳහා භාවිතා කළ දෙහිඕවිට නාන තොටුපළ තිබෙන ස්ථානයත් සභාවට අයිති බවට දැනගැනීමට ලැබී තිබූ බව පැවසූ එතුමා මේ වන විට එම ස්ථානයේ වැලි ගොඩදැමීමක් සිදු වන බවට තොරතුරු දැන ගැනීමට ලැබී ඇති බව පවසා සිටියේය. මේ වන විටඑම ස්ථානයේ වැලි ගොඩ දැමීම හේතුවෙන් ඇළ හැරී ගොස් ඇති අතර ජල සම්පාදන මණ්ඩලයෙන් ජලය ලබා දීමේ කාර්ය සඳහාත් මෙය එක්තරා ආකාරයක අවහිරයක් වී ඇති බව පවසා සිටියේය. සභාව සතු නාන තොටුපලක් තිබෙන ස්ථානයක් අසල වැලිතොටුපලක් පවත්වාගෙන යාම සඳහා අවසර ලබා දුන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් සොයා බලන ලෙසත් ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට බස් නැවතුම්පළේ ඇති අනවසර ඉදිකිරීම් සියල්ලටම දින 14ක් ඇතුලත ඒවා ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ලිඛිතව දන්වා යවා ඇති බව පැවසීය. මේ වන විට මායිම් ගල් ඉවත් කර නැති බවත් තමන් පෞද්ගලිකව ගොස් එය පරීක්ෂා කළ බවත් එය කහ වර්ණයෙන් ලකුණු කර ඇති බැවින් පැහැදිලිව හඳුනා ගත හැකි බව පවසා සිටින ලදී.

**(උ) වෙනත් කරුණු:**

සභාවට දන්වා නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම:

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා:**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නයනා ප්‍රියන්ති මැතිණිය අසනීප තත්වයන් හේතුවෙන් අද දින මහා සභා රැස්වීම සඳහා නොපැමිණෙන බව පවසා ඇති බැවින් ඔවුන් වෙනුවෙන් නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නයනා ප්‍රියන්ති මැතිණියගේ අසනීප නිවාඩු අනුමත විය.

**ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ඉදිරිපත් කිරීම:**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා:**

අද දින මහා සභා රැස්වීම ආරම්භක අවස්ථාවේදී විපක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් කුප්පි ලාම්පු දල්වාගෙන සභා ගර්භයට පැමිණියේ අද වන විට මේ ප්‍රදේශයේ සහ රටේම ජනතාව විශාල අසහනයකට ලක් වූ කරුණක් සම්බන්ධයෙන් මේ සභාවේ අවධානය යොමු කිරීමට බව පවසා සිටියේය. මේ රජය බලයට පත් වී ටික කාලයකින් වෙළඳපොළේ ගෑස් හිඟ වූ බවත් කාලයකට පසු ගෑස් මිල වැඩි කර ගෑස් නැවත ලබා දුන් බවත් ඉන් පසු එලෙස ලබා දුන් ගෑස් පිපිරීමට ලක් වූ බවත්

පවසන ලදී. මිනිස් ජීවිත ආරක්ෂා කර ගැනීම සඳහා පසුව ලාම්පුතෙල් ලිප් ගැනීමට ජනතාව යොමු වූ බවත් අද වන විට ජනතාවට ලාම්පු තෙල් ලබා ගැනීමට නොහැකි වී ඇති බවත් පැවසීය. පසුගිය කාලයේදී මහා සංඝරත්නය පවා මේ රජය බලයට පත්කිරීම සඳහා විශාල කැප කිරීමක් සිදු කළ බවත් විශේෂයෙන් කැළණිය රජමහා විහාරස්ථානයේ ස්වාමින්වහන්සේගේ ක්‍රියා කළාපය මේ අවස්ථාවේ සිහිපත් වන බව පැවසීය. මෙවැනි සිදුවීම් උලුප්පා දක්වමින් මහජනතාවගේ අනුකම්පාව දිනා ගනිමින් මේ රජය බලයට පත් වූ බවත් ලෝකයේ කිසිම රටක නොමැති ආකාරයකට එකම පවුලේ සහෝදර සහෝදරියන් සහ ඥාතීන් දේශපාලන බලයට පත් වූ බවත් පසු කාලීනව තවත් එම පවුලේම තවත් සහෝදරයෙක් මුදල් අමාත්‍යධුරය පත් කර ගත් පසු මෙය ජාතික ගැටළුවක් බවට පත් වූ බව පවසා සිටියේය. අද වන රටේ කොයි දෙසින් බැලුවත් තම එදිනෙදා ජීවිතයට අත්‍යාවශ්‍ය භාණ්ඩ මිලදී ගැනිම සඳහා ජනතාව දිගු පෝලිම් වල දුක් විදින ආකාරය දක්නට ලැබෙන බව පැවසීය. මේවා ජාතික ප්‍රශ්න ලෙසින් පෙන්වා කතා කිරීමට අවස්ථාව ලබා නොදීමට උත්සාහ කරනු ඇති බවත් නමුත් මගේ ගමේ ජනතාව අද වන විට මේ පීඩනයේ ගොදුරු බවට පත්ව ඇති නිසා රටට ආදායමක් උපයා දෙන ශ්‍රම සම්පත මේ ආකාරයට දිගු පෝලිම් වල කාලය ගෙවා දමන නිසා මේ සම්බන්ධයෙන් මේ සභාවේ කතා කිරීමේ අයිතියක් ඇති බව පවසා සිටියේය. මේ ආකාරයට ජනතාව පීඩාවට පත් කර ඇති වාතාවරණයක් තුළ රටේ සංවර්ධන කාර්යන් සඳහා මේ ජනතාවගේ සේවය ලබා ගන්නේ කොසේද යන්න අවබෝධ කර ගත නොහැකි බවත් අද දින මේ දුක් විදින ජනතාවගේ පීඩනය සංකේතවත් කිරීම සඳහා විපක්ෂය ගනු ලැබූ ක්‍රියා මාර්ගය හේතුවෙන් හෝ අදාල බලධාරීන්ගේ අවධානය මේ කරුණු සම්බන්ධයෙන් යොමු කිරීමට ගරු සභාපතිතුමාට සිතුවිල්ලක් පහල වේවායි ප්‍රාර්ථනා කරන බව පවසා සිටියේය. අද දින සභාවේ ජලය වීදුරුවකට ලබා දීම සම්බන්ධයෙන් නම් සෑහීමකට පත් විය නොහැකි බවත් අද වන විට විපක්ෂයේ අපි දිගින් දිගටම රජයේ ක්‍රියා කලාප විවේචන කරන නිසා මේ ආකාරයට ජලය පානය කිරීම බිය උපදවන කරුණක් බව පවසා සිටියේය.

(සභාව සෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ. පියරත්න මැතිතුමා:**

පසු ගිය මහා සභා රැස්වීම් කීපයකදී සභාවට පානීය ජල බෝතල් ලබා ගැනීම සම්බන්ධයෙන් තමන් විසින් සිදු කරන ලද ප්‍රකාශ නිවැරදිව අවබෝධ කර නොගෙන මේ ආකාරයට අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණෙන මන්ත්‍රීවරුන් සඳහා ජල වීදුරු ලබා දී ඇති බව පැවසීය. ජල බෝතල් ලබා නොදෙන ලෙස තමන් නොපැවසූ බවත් ප්‍රදේශයේ ජනතාවට කහනාවිට ඇල්ලෙන් එන ජලය පානය කිරීමට හැකි නම් සභාවට පානීය ජල බෝතල් මිලදී ගන්නේ ඇයිද යන්න සම්බන්ධයෙන් තමන් විමසූ බවත් ඒ සඳහා විකල්පයක් ලෙස ජල පෙරන යන්ත්‍රයක් සභාවට ලබා ගැනීමට හැකි බවත් තමන් විසින් පෙන්වා දුන් බව පවසන ලදී. එසේ නම් මේ සභාවේ මන්ත්‍රීවරුන් සඳහා සංග්‍රහ ලබා දීමත් අනුමත කළ නොහැකි බවත් ඒ සඳහා වැය වන්නේත් මහජන මුදල් බව පවසා සිටියේය.

(සභාව සෝෂාකාරී)

ගනිමින් ඒවාගේ නඩත්තු කටයුතු සාර්ථකව සිදු වූ බව පවසා සිටියේය. කොන්ක්‍රීට් සංකල්පය හේතුවෙන් කොමිස් ගැසීම සඳහා වැඩි අද දිනයේත් සභා දේපල තුළ සහ බල ප්‍රදේශයේ සිදු කරනු ලබන අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් කතා වූ බවත් ලිපි යැවුවාට කිසිදු අවස්ථාවක ඒවා ඉවත් කර ගැනීමක් සිදු නොකරන බවත් පවසා සිටියේය. දෙහිඕවිට බස් නැවතුම්පළේ කඩ 03 කට එක් නීතියකුත් අනෙක් කඩ සඳහා තවත් නීතියකුත් ක්‍රියාත්මක වන්නේ කොසේද යන්න තමන්ට ගැටළුවක් බව පැවසූ එතුමා අද වන විට පදිකවේදිකාවේ මහජනතාවට ගමන් කිරීමට නොහැකි වන ලෙස විශාල වශයෙන් අනවසර ඉදිකිරීම් සිදු කර ඇති බව පැවසීය. මීට පෙර තමන් විසින් පෙන්වා දුන් ඉරටි වත්ත මාර්ගය ඉදි කිරීමේදි සිදු වූ අක්‍රමිකතා සම්බන්ධයෙන් අද වන විටත් කිසිදු පරීක්ෂණයක් සිදු කිරිමට මේ සභාවේ අවධානය යොමු වී නැති බවත් කැන්දගස්පිටිය බස් නැවතුම්පළේ මඟී ආවරණය මේ වන තෙක් සකස් කර නැති බවත් පෙන්වා දෙන ලදී. තමන් එදත් අදත් මේ ඡන්ද ක්‍රමයට විරුද්ධ වූ බවත් පැරණි ක්‍රමයට පළාත් පාලන ඡන්ද විමසීමත් පැවැත් විය යුතුය යන මතයේ තමන් අදටත් සිටින බව පවසා සිටියේය. මේ රජය විසින් ඇති කර තිබෙන ගෑස් අර්බුදය හේතුවෙන් අද වන විට නගරයේ හෝටල් වසා ඇති බවත් එම කඩ වල සේවය කරනු ලබන සේවකයන්ට අද ජීවත් වීමට මාර්ගයක් නොමැති වී ඇති බවත් පවසා සිටියේය. මේ රටට මේ විනාශය සිදු කරනු ලැබුවේ කොන්ක්‍රීට් සංකල්පය හේතුවෙන් බවත් තාර දමා තිබූ කාලයේ පළාත් පාලන

ආයතන වල කම්කරුවන් යොදා වශයෙන් යොමු වූ බවත් ලක්ෂ එකහමාරක් දෙකක් වන විට වැඩ අවසන් කළ හැකි මාර්ග සංවර්ධනය සඳහා කියමින් රුපියල් ලක්ෂ 15 /16 බැගින් මුදල් අය කර ගැනීමට කටයුතු කිරීමෙන් මේ ආර්ථික අර්බුද නිර්මාණය වූ බව පෙන්වා දෙන ලදි. ැද වන විට බඩු මිල දෙගුණ වී ජනතාවට ජීවත් විය නොහැකි තත්වයට ඔවුන් අසරණ වී ඇති බවත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ක්‍රීඩා පිටි සකස් කළේ ලෝකයේ රටවල් වලට ණය වී නොවන බවත් මහින්ද රාජපක්ෂ මහතා ක්‍රීඩා පිටි සකස් කළේ ලෝකයෙට් රටවල් වලින් ආධාර ලබා නෙ බවත් පැවසූ එතුමා අද වන විට ඒ කිසිවක් ගැන කිසිවෙකු කතා නොකරන බව පැවසිය.

(ගරු මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.51)

එසේ වීමට හේතුව අසාධාරණයට විරුද්ධව කතා කරනු ලබන මන්ත්‍රීවරුන්ට මේ වන විට සිය මන්ත්‍රී ධූරය අහිමි වන බැවින් ඒ සම්බන්ධයෙන් කතා කිරීම සඳහා ඉදිරිපත් වීමට ඔවුන් බියක් දක්වන බව පැවසීය. හිටපු අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත , විමල් වීරවංශ, උදය ගම්මන්පිල මහත්වරුන්ට සිදු වූයේ එම ඉරණම බව පැවසීය.

(ගරු මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.52)

තම මන්ත්‍රී ජීවිතයේ තමන් දුටු සුවිශේෂී චරිතයක් ලෙස ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා හැඳින්වීමට කැමති බවත් එතුමා සතු සෑම අවස්ථාවකම සෘජුව අදහස් ප්‍රකාශ කිරීමේ ගුණාංගයට තමන් ගරු කරන බවත් පවසා සිටියේය. එම ගුණාංගය නිසා මන්ත්‍රී ධූරය අහිමි වූ දිනක නගරයේ අභිමානයෙන් ජීවත් වීමේ හැකියාව එතුමාට තිබෙන බව පවසා සිටියේය. ැද වන විට රට මුහුණ දී ඇති ගැටළු හමුවේ ඩොලර් ප්‍රශ්නය විසඳන තෙක් මාර්ග සංවර්ධන කටයුතු සිදු නොකරන බවට මේ සභාවෙන් තීරණයක් ගත හැකි නම් ඒ සම්බන්ධයෙන් ඉහල බලධාරීන්ට දන්වා යැවීමට හැකි නම් සැබවින්ම ජනතා හිදවාදී දේශපාලන නියෝජිතයන් සිටින සභාවක් ලෙස මේ සභාව හැඳින්විය හැකි බව පැවසූ එතුමා හැකි නම් එම තීරණය ගැනීමට ක්‍රියා කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

(ගරු මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා සහ ගරු මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා සභාවට පැමිණෙන ලදි.ප:ව: 12.00)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ශ්‍රියානි ජයකොඩි මැතිණිය:**

අද ජාත්‍යන්තර කාන්තා දිනය බවත් නමුත් සමස්ථ ලෝකයේ කාන්තාවන් දෙස බැලුවත් අද වන විට ලංකාවේ කාන්තාවන් මුහුණ දෙන ආකාරයේ ගැටළු නොමැති බව පැවසුවාය. වෙළඳසැල් වල බඩු මිල දිනෙන් දින ඉහල යන බවත් මෙය ගෘහනියන්ට කිසිසේත් දරා ගත නොහැකි තත්වයක් බැවින් කාන්තා දිනයේදී ඉල්ලා සිටින්නේ මේ බඩු මිල අඩු කිරීම සඳහා කටයුතු කරන ලෙසයි. එසේම කනංගම කොට්ඨාශයේ රුවන්වැලිගම ගමේ පිහිටි ප්‍රජා ශාලාව නිවාස සංවර්ධන අධිකාරියට අයත් බවත් එහි මීට පෙර පෙර පාසලක් ක්‍රියාත්මක වුවත් නාය යෑමේ අවධානමක් ඇති බව පවසා එය මේ වන විට නවතා ඇති බවත් පැවසුවාය. ඒ අනුව දැනට කිසිදු කාර්යක් සඳහා භාවිතයට නොගන්නා එම ප්‍රජා ශාලාව සභාවට පවරාගෙන එහි පුස්තකාලයක් පවත්වාගෙන යාමට හැකියාව ඇත්දැයි සොයා බලා ඒ සඳහා අවශ්‍ය කටයුතු සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

අද වන විට රටේ ජනතාව විශාල ආගාධයකට වැටී ඇති බවත් එම ගැටළුවෙන් ජනතාව දැවී පිච්චී යන තත්වයට පත්ව ඇති පවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා, ගරු මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.ප:ව: 12.06)

අද වන විට මේ සභාවට පැමිණෙන මහජන නියෝජිතයන් දකින ජනතාව දීමනා ලබා ගැනිම සඳහා පමණක් සභාවට පැමිණෙන පිරිසක් ලෙස අපට චෝදනා නඟන ආකාරය තමන්ට ඇසී තිබෙන බවත් ජනතාව මෙතරම් අසරණ වී ඇති අවස්ථාවක රටේ නායකයින්ට මේ සම්බන්ධයෙන් නොපෙනීම කණගාටුවට කරුණක් බවත් පැවසීය. මේ වන විට රටේ නායකයා මේ කිසිවක් නොදකින

තැනැත්තෙකු ලෙස සඳළුතලයට වී සිටින බවත් අඩු තරමින් ජනතාව පත්ව ඇති ව්‍යසනය ප්‍රාදේශීය දේශපාලන නායකයන් ලෙස මේ සභාව නියෝජනය කරන පිරිස් මඟින් හෝ ඉහළ දේශපාලන අධිකාරියට දැන්වීම සිදු විය යුතු තත්වයක් මේ වන විට උද්ගත වී ඇති බව පෙන්වි දෙන ලදී.

( ගරු මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා සභාවට පැමිණෙන ලදී.ප:ව: 12.08)

මීට පෙර මහා සභා රැස්වීම් වලදීත් තමන් මේ සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු කළ බවත් එදා තමන් විසින් ලබා දුන් ඇතැම් ඉඟි අද වන විට යතාරථයක් බවට පත්ව ජනතාවට ඒ අර්බුදයන්ගේ පීඩන විඳීමට සිදුව ඇති බව පෙන්වා දුන් එතුමා එදා තමන්ට එම අදහස් දැක්වීමට අවස්ථාව ලබා නොදී ජාතික දේශපාලනයට අදාල කරුණු යැයි පවසමින් ඒවා නිශ්ප්‍රභා කළ ආකාරය සිහිපත් කර සිටියේය. මේ ගැටළු ගැන කතා කිරීමේදී වර්තමාන රජය ප්‍රකාශ කරන්නේ මේවා යහපාල රජය මඟින් ඇති කරන ලද ගැටළු ලෙස බවත් නව කැළණි පාලම විවෘත කිරීමේ උත්සවයේදී අගමැතිතුමා පැවසුවේත් යහපාලන රජය ණය ලබා ගත්තා මිස කිසිවක් සිදු නොකළ බවත් 2005, 2014 කාලය තුළ අධිවේගී මාර්ග ඉදි කිරීම ඇතුළු බොහෝ සංවර්ධන ව්‍යාපෘති සිදු කරන ලද්දේ තමන්ගේ රජයන් විසින් බවත් යැයි පැවසූ එතුමා බලයට පැමිණෙන විට ලබා දුන් බොරු පොරොන්දු ඉටු කර ගැනීමට නොහැකි වූ විට ඒ ආකාරයට පැවති රජයට චෝදනා කිරීමට මොවුන් පෙළඹී ඇති බව පවසා සිටියේය. එසේම 1833 සිට පැවති අධිරාජ්‍යවාදී පාලනය ක්‍රමය නිසා මෙය සිදු වන බවත් ඇතැම් පිරිස් 1948 සිට පාලනය සිදු කළ පිරිස් මෙයට වගකිව යුතු බව පවසන අතර තවත් පිරිසක් විසින් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විසින් හඳුන්වා දුන් විවෘත ආර්ථිකය හේතුවෙන් මේ තත්වය උද්ගත වූ බව පවසන බවත් පෙන්වා දුන්නේය. මේවායේ යම් සත්‍යතාවයක් තිබිය හැකි වුවත් විදේශිකයන් මේ රටින් යන විට අපට ලබා දුන්නේ ණය නොමැති රටක් බව පැවසීය. එම නිසා ඔවුන් මෙයට වගකිව යුතු නැති බව පැවසීය.

( ගරු මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. ප:ව: 12.09)

අද වන විට රට තුළ ඇති වී තිනෙ තත්වය ඉතාමක් බරපතල බවත් මේ රට මේ වන විට ස්වෛරීව බංකොලොත් වන තත්වයකට පත්ව ඇති බව පෙන්වා දෙන ලදී. එදා මෙදාතුර ඉතිහාසයේ අප රට තුළ මේ ආකාරයේ ඛේදවාචකයක් සිදු වී නොමැති බවත් මෙලෙස සිදු වූ ලෝකයේ වෙනත් රටවල් තිබෙන බවත් ඒවා යථා තත්වයට පත් කර ගඅනීමට නොහැකි වී ඇති බව පැවසීය. 2010 දී බංකොලොත් වූ ග්‍රීසිය 2020 දී බංකොලොත් වූ ලෙබනනය ආදී රටවල් මේ වන විටත් නැවත යථා තත්වයට පත් වී නොමැති බව පැවසීය. ලෙබනන් රාජ්‍යයන් පසු ඒ ආකාරයෙන් බංකොලොත් භාවයට පත් වූ රටක් ලෙස ඉදිරියෙන්ම සිටින්නේ ශ්‍රී ලංකාව බව පවසා සිටියේය. මෙලෙස සිදු වූ විට නැවත රටක් යතා තත්වයට පත් වීමට දශක ගණනාවක් යන බැවින් මේ සම්බන්ධයෙන් සංවේදීව සිතා බැලිය යුතු බව පෙන්වා දෙන ලදී. මේ රටට මෙලෙස සිදු වූයේ කුමන හේතුවක් නිසාද යන්න සොයා බැලූ විට 1948- 1977 , 1977- 2005, 2005 න් පසු කාල සීමාව ලෙස ගෙන බැලූ විට 1948 , 1977 කාලයේ දී විශාල ණය ලබා ගත්තත් ඒවා ලබා ගත්තේ දීර්ඝ කාලීන ගෙවීමේ ක්‍රමයට නිසා එහි බරක් නොවූ බවත් පසුව ජේ.ආර්.ජයවර්ධන මැතිතුමාගේ කාලයේදී ආදායමට වඩා වියදම වැඩි වුණත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල , ලෝක බැංකුව ආදී ආයතන වලින් අඩු පොලියකට වැඩි කාලයකදී ගෙවීමට ණය ලබා ගත් නිසා ගැටළුවක් ඇති නොවූ බව පැවසීය. නමුත් 2005 පසු කාලයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේදී ණය ලබා ගත්තේ වාණිජ මට්ටමින් බවත් එච්.රස්.බී.සී.බැංකුව චීන සිටි බැංකුව ආදී බැංකු වලින් කෙටිකාලයකින් ගෙවීමේ පදනම මත අධික පොළියක් ගෙවීමේ පදනමට මෙම ණය ලබා ගත් බව පැවසීය. රටේ ඇති වුණා යැයි පවසන විශ්මිත සංවර්ධනය මොවුන් සිදු කරන ලද්දේ මේ ආකාරයෙන් අධික පොළියක් යටතේ විශාල වශයෙන් ණය ලබා ගෙන බව පෙන්වා දුන් එතුමා ඒ හේතුවෙන් අද වන විට මේ රට මේ ආකාරයේ දැඩි මූල්‍ය අර්බුදයකට ලක් වී ඇති බවත් පෙන්වා දෙන ලදී. මේ ආකාරයට බැලූ විට 2005 – 2015 තාලය තුළ මේ රට විශාල මූල්‍ය මංකොල්ලයකට ලක් වූ බවත් එහි ප්‍රතිවිපාක අද වන විට ජනතාව විඳිමින් සිටින බව පැවසීය.

( ගරු මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා සභාවට පැමිණෙන ලදී. ප:ව: 12.14)

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාවකට අනුව 2005 – 2015 කාලය තුළ මේ රටින් පිටව ඇති ඩොලර් ප්‍රමාණය ඩොලර් බිලියන 19 ක් බවත් 2014 කාලයේදී මේ රටේ සමස්ථ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 14 ක් බවත් පෙන්වා දුන් එතුමා ලංකාව ලබා ගෙන ඇති ණය වලින් 80%ක් මේ ඒ කාල සීමාව තුළ මේ

රටින් පිටවී ඇති බව පැහැදිලි වන බව පැවසූ එතුමා මේ ධනස්කන්ධයට සිදු වූයේ කුමක්ද ඒවා ඇත්තේ පැන්ඩෝරා පත්‍රිකා වලද යන්න අදටත් අභිරහසක් බව පවසා සිටියේය. අද වන විට මේ ප්‍රදේශයේ ජනතාවට ගෑස්, කිරිපිටි, ඩීසල් , පෙට්‍රල්, භූමි තෙල් කිසිවක් නොමැති බවත් හාල් පරිප්පු සීනි හාල් මැස්සෝ ආදී බඩු බාහිරාදිය කිසිවක් මිලදී ගැනීමට නොහැකි තත්නයකට පත්ව ඇති බව පැවසීය.

(සභාව සෝෂාකාරී)

මේ තත්වය තුළ මේ රට ගොඩ නැඟීමට ඇති එකම විකල්පය රට ගොඩනැඟීමේ කාර්ය මහජනතාව වෙත ලබා ගැනීම බව පැවසූ එතුමා 2018 දී චිලී රටේ ජනතාන ලක්ෂ ගණනින් මහ පාරට බැසි පැවති රජය ඉවත් කර නව මැතිවරණයක් ඉල්ලා උද්ඝෝෂණය කළ ආකායට සිහිපත් කළ එතුමා ශ්‍රී ලංකාව තුළද ඒ තත්වය උදා වන දිනය වැඩි ඈතක නොවන බව පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

අද දින සභාවේදී ලිපි පෙත්සම් යටතේ වීථි පහන් දැල්වීම අවම කර විදුලි පරිභෝජනය සීමා කිරීමට අදාලව ලිපියක් ඉදිරිපත් කළ බවත් දැනට පවතින අවශ්‍යතාවයට අනුව ඒ කාර්ය සිදු කරමු යැයි පවසා සිටියේය. එසේම මේ වන විට කොහෙළිය රඹුක්වැල්ල, මහින්දානන්ද අලුත්ගමගේ විමල් වීරවංශ වැනි රජයේ අමාත්‍යවරුන් විසින් විදුලි බල මණ්ඩලයට ගෙවිය යුතු මුදල් ද අය කර ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටීමට කටයුතු කරමු යැයි පවසා සිටියේය. අද වන විට රජයේ තත්වය මේ සභාවේ මන්ත්‍රීවරුන්ද තේරුම් ගෙන ඇති බවත් ඒ නිසා විපක්ෂයේ මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කිරීමේදී ඔවුන් සභාවෙන් පිටතට යන බවත් පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා:**

මේ වන විට සභාවේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් සිටින්නේ ඉතිමක් අඩුවෙන් බවත්මාසයකට වරක් පමණක් පැවැත්වෙන මහා සභා රැස්වීමට පැමිණ එහි රැදී සිටීමට මන්ත්‍රීවරුන්ට නොහැකි නම් එය කණගාටුවට කරුණක් බව පවසා සිටියේය.එසේම කාරක සභා රැස්වීම් සඳහා සහභාගී වීමේදීත් මන්ත්‍රීවරුන්ගේ මේ දුර්වලතාවය දක්නට ඇති බවත් මේවා නිවැරදි කර ගත යුතු බව පැවසීය.

(සභාව සෝෂාකාරී)

අද වන විට රට තුළ ඇති වී තිබෙන ප්‍රශ්න සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන් අදහස් ප්‍රකාශ කළ බැවින් ඒ සම්බන්ධයෙන් කතා නොකරන බවත් අද වන විට විදුලි බිලට සිදු වී ඇති ගැටළුවක් සම්බන්ධයෙන් මේ සභාවේ අවධානය යොමු කිරීමට අදහස් කළ බවත් පවසා සිටියේය. පසුගිය දින වල බොහෝ විදුලි බිල් වලට රු.3000 බැගින් එකතු කර ඇති බවත් ඒසේ එකතු කර ඇත්තේ විදුලිය කැපීම සඳහා පැමිණීම වෙනුවෙන් බවට දක්වා ඇති බවත් පැවසීය. මෙ ඉතාමත් අසාධාරණ තත්වයක් බවත් මිනිසුන්ට ජීවත් වීමට නොහැකි තත්වයක පවතින අවස්ථාවේ මේ ආකාරයෙන් සිදු කිරීම සම්බන්ධයෙන් කරුණු විමසූ විට විදුලිය කැපීමට පැමිනීම වෙනුවෙන් එම මුදල අය කර ඇති බව පැවසූ බවත් තමන්ගේ නිවසේ ඒ ආකාරයට විදුලිය කපා නොමැති බවත් පවසා සිටියේය. මෙය පැහැදිලිව සිදු කරන මාෆියාවක් බවත් පවසන ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමාගේ විදුලි බිලෙන් ඒ ආකාරයට මුදලක් අය කර ගත්තාද යන්න විමසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා:**

එම මුදල බිල්පතින් ඉවත් කර ගැනීමට ලිපියක් ලබා දෙන ලෙස දැන්වූ බවත් විමසීම් සිදු කරන විට හෙට පවසන්නම් යැයි කියමින් මගහරින බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

ඒ සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කිරීමට කටයුතු කරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා:**

නාපාවලට කසළ එකතු කිරීමේ ට්‍රැක්ටර් රථය පැමිණෙන දින වලදී තවත් මීටර් 100ක් ඉදිරියට පැමිණ නාපාවල පාසල අසල කසළ එක් රැස් වී තිබෙන ස්ථානයේ කසළ ටික එකතු කරගෙන යාමට හැකියාවක් ඇත්නම් පාසල් දරුවන් නිරන්තරයෙන් ගමන් ගන්නා මාර්ගයක් බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටියේය. එසේම පවතින නියං තත්වය හේතුවෙන් නාපාවල ප්‍රදේශයේත් උග්‍ර ජල හිඟයක් ඇති වී තිබෙන බැවින් එම ප්‍රදේශයටත් ජල බවුසරය යැවීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

රජයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් විපක්ෂය චෝදනා කළත් මේ සියල්ල යථා තත්වයට පත් කිරීමට පෙර තවමත් කොරෝනා රෝග ව්‍යාප්තිය යම් තරමකින් පාලනය වූවා පමණක් බව අවබෝධ කර ගැනීමට ඔවුන් අපොහොසත් වී ඇති බව පැවසීය.

( ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා, ගරු මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා, ගරු මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්. දරුක් මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා, ගරු මන්ත්‍රිනී ශ්‍රියානි ජයකොඩි මැතිණිය, ගරු මන්ත්‍රිනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය සභාවෙන් පිටතට යන ලදී. ප:ව: 12.29)

මේ රජය කුමන කාර්යක් සිදු කළත් විපක්ෂය සැම අවස්ථාවකම සිදු කළේ එය විවේචනය කිරීම බවත් පෝර්ට් සිටි ව්‍යාපෘතිය සිදු කර අවසන් වන විට මේ රටේ කළු ගල් අවසන් වී තිබිය හැකි බවට ප්‍රකාශ කළ බව පැවසූ එතුමා අද වන විට ඩොලර් ප්‍රශ්නය ඇතුළු අනෙකුත් ගැටළු අවබෝධයෙන් කළමනාකරණය කර ගැනීම සිදු කළ යුතු බව පවසා සිටියේය. මේ රජය ණය ලබා ගත් බව සත්‍යයක් බවත් නමුත් එලෙස ණය ලබා ගෙන සිදු කරන ලද හම්බන්තොට වරාය වැනි ව්‍යාපෘති දිගුකාලීන ආයෝජන බවත් පෙන්වා දෙන ලදී. මේ රජය සැම විටම ජනතාවට සහය ලබා දීමට කටයුතු කළ බවත් මේ සංකීර්ණ අවස්ථාවෙන්ද කඩිනමින් ගොඩ ඒමට හැකියාව අප සතුව පවතින බව පැවසූ එතුමා හැකි ඉක්මණින් මේ ගැටළු විසඳාගෙන ජනතාවට සහය ලබා දීම සඳහා කටයුතු කරනු ඇති බවත් පවසි සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. අබේසේන මැතිතුමා:**

මේ මොහොත වන විට විපක්ෂය සම්බන්ධයෙන් තමන් කණගාටු වන බවත් සභා ගර්භය තුළ රැඳී සිටින්නේ එක් මන්ත්‍රීවරයෙක් පමණක් බවත් පවසා සිටියේය. විපක්ෂයේ මේ ක්‍රියාකාරිත්වය ඒ පක්ෂයේ ස්වභාවය බවත් 1948 සිටම මෙය ඒ ආකාරයෙන්ම සිදු වූ බවත් පවසා සිටියේය. මේ රටේ විනාශයට මුල් වූයේ 1977 හඳුන්වා දුන් විවෘත ආර්ථික ක්‍රමය බව තමන් අදත් නොපැකිලිව ප්‍රකාශ කරන බවත් වාමාංශික දේශපාලනය නියෝජනය කර හොඳ නායකයන් බොහොමයක් මේ රටේ එවකට සිටි බවත් එන්.එම්.පෙරේරා, දොස්තර වික්‍රමසිංහ, පීටර් කේනමන් වැනි උගත් බුද්ධිමත් නායකයන් ඒ අතර වූ බව පවසා සිටියේය. නමුත් එක්සත් ජාතික පක්ෂය බලයට පත් වූ පසු දේශිය නිෂ්පාදන නඟා සිටුවීම වෙනුවට ඒවා සහමුලින් විනාශ කර දැමීමේ ක්‍රමවේදයක් අනුගමනය කළ බවත් පවසා සිටියේය. ඒ අනුව කැළණි ටයර් කර්මාන්ත ශාලාව, දැව සංස්ථාව වැනි දේශීය කර්මාන්ත ශාලා විනාශ කර ගත්තේ මොවුන් විසින් බවත් පැවසීය.

( ගරු මන්ත්‍රී ලක්මාල් සමරරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී.ප:ව: 12.37)

මේ රට ඩොලර් නිෂ්පාදනය කළ රටක් බවත් 1972 තිබූ හිඟ සකස් කර 1977 වන විට මෙරට තුළ ඩොලර් අතිරික්තයක් තිබූ බව පැවසූ එතුමා ඒ සියල්ල විවෘත ආර්ථිකය සමඟ රටට අහිමි වී ගොස් ලෝකයේ රටවල් වලට ණය වන තත්වයට ශ්‍රී ලංකාව පත් වූ ආකාරය පෙන්වා දෙන ලදී. තත්වය කොසේ වුවත් කවුරු කුමක් පැවසුවත් ඒ කිසිවකට මේ රජයේ ගමන් මඟ වෙනස් කළ නොහැකි බවත් මේ වන වසර තුළ කර්මාන්ත 19 රට තුළ ආරම්භ කිරීමට පියවර ගන්නා බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා:**

වෙලන්ගල්ල වත්තේ තිබූ ජල ගැටළුව සම්බන්ධයෙන් විසඳුම් ලබා දෙන බවට අදාල පාර්ශව විසින් පොරොන්දු වුවත් මේ වන තෙක් එම ගැටළුව විසඳී නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අදාල පාර්ශව සභාවට කැඳවා මේ සම්බන්ධයෙන් විමසා බැලීමට උපදෙස් ලබා දෙන බව පැවසීය. කොරෝනා රෝග ව්‍යාප්තිය හේතුවෙන් රටේ සමාන්‍ය කටයුතු සැලසුම් කර පරිදි සපුරා ගැනිමට නොහැකි වූ බවත් අද ජාත්‍යන්තර කාන්තා දිනය වුවත් පෙර අවස්ථා වල මෙන් සැලසුම් කර වැඩසටහනක් සිදු කිරීමට නොහැකි වූ බවත් සභාපතිතුමාගේ නිවේදන යටතේ අද වන විට රට පත්ව ඇති ආර්ථික අර්බුදයට හේතුව 1948 සිට පසුගිය වසර ගණනාවක් පුරා මේ රට පාලනය කරන ලද විවිධ රජයන් විසින් සිදු කරන ලද ක්‍රියාවන්ගේ ප්‍රතිඵලයක් බවට තමන් විසින් සිදු කරන ලද ප්‍රකාශයට අදාල කරුණ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා විසින් දීර්ඝ විග්‍රහයක් සිදු කළ බවත් පැවසීය. මහින්ද රාජපක්ෂ මැතිතුමා සිය පාලන කාලයේදී විදේශ ණය ලබා ගත් බව සත්‍යක් බවත්  එතුමා ලොව ප්‍රබලතම ත්‍රස්තවාදී කණ්ඩායමක් සමඟ පැවති තිස් අවුරුදු යුද්ධයක් නිමා කළේ එතුමා බවත් ඒ සඳහා අවශ්‍ය අවි ආයුධ සහ වෙනත් ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ණය ලබා ගැනීමට සිදු වූ බවත් පෙන්වා දෙන ලදී. නමුත් 2015 න් පසු හින්ද රාජපක්ෂ මැතිතුමාගේ මැතිවරණ පරාජයෙන් පසු මේ රටේ බලයට පත් වූ රජය විසින්ද ණය ලබා ගත් බව අමතක නොකළ යුතු බවත් ඒ ලබා ගත් ණය වලට සිදු වූ දේ එකින් එක පැහැදිලි කිරීම අනවශ්‍ය බවත් පැවසීය. බැඳුම්කර වංචා වවලට සම්බන්ධ පුද්ගලයන් මේ වන විටත් විදේශගතව යහතින් සිටින බවත් ඔවුන් විසින් නිර්මාණය කරන ලද ඩොලර් අර්බුද වල ප්‍රතිඵල මේ වන විට අපිට භුක්ති විදීමට සිදු වී ඇති බවත්  පෙන්වා දෙන ලදී. 2005 – 2015 කාලය තුළ සමස්ථ රටම එකම වැඩ බිමක් බවට පත් වී සීඝ්‍ර සංවර්ධන ව්‍යාපෘති රැසක් සිදු කළ බවත් මේ රටේ පාසල් පද්ධතියට මාර්ග පද්ධතියට විශාල සේවාවක් ඒ මඟින් සිදු වූ බවත් සිහිපත් කළ එතුමා ඒවා වැඩි දියුණු කිරීම  රජයක වගකීම බවත් පැවසීය . රටක යටිතල පහසුකම් වැඩි දියුණු වනවා නම් රටේ සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා එය මහත් සේ ප්‍රයෝජනවත් වෙන බවත් 2015 දක්වා මේ රට ඒ බලාපොරොත්තු වූ ඉලක්ක කරා රැගෙන ගිය බව පවසා සිටියේය. නමුත් 2015 පසු ඒ ආකාරයට රටේ සම්පත් උපයෝගී කර ගනිමින් සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘති කිසිවක් දැකිය නොහැකි බවත් ඒ කාල සීමාව තුළ විශාල හොරකම් සහ වංචා පමණක් සිදු වූ බව පවසා සිටියේය. අද වන විට ජනතාව ඉතාමත් බුද්ධිමත් බවත් මේ එකාන් එක විස්ත කිරීම අනවශ්‍ය බවත් පැවසූ එතුමා 2015 න් පසුත් මේ ආකාරයෙන්ම තේල පෝලිම් තිබූ බවත් නමුත් එදා අද තරම් රට ආර්ථික අවපාතයකට ලක්ව නොතිබූ බැවින් ඒ සම්බන්ධයෙන් වැඩියෙන් කතා කිරීමක් සිදු නොවන බව පැවසීය. පසුගිය කාලයේදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විශාල වශයෙන් මුදල් සොරකම් කර ඇති බවටත් ඒ සොරකම් කරන ලද මුදල් වලින් ලැම්බෝ ගිනි රථ 18 ක් ගෙන ආ බවටත් විපක්ෂය විසින් අසත්‍ය ප්‍රකාශ නිකුත් කර බවත් අද වන විට ඒ සියල්ල බොරු බවට පත් වී ඇති බව පැවසීය. එම නිසා අද වන විට එවැනි අසත්‍ය ප්‍රකාශ වලින් රැවටිය හැකි ජනතාවක් නොමැති බවත් මේ සියළු කරුණු කෙරෙහි ජනතාව විමසිල්ලෙන් හා බුද්ධිමත්ව  බලා සිටින බවත් පවසා සිටියේය. අද වන විට සමාජ මාධ්‍ය මඟින් හෝ වෙනත් කුමන ආකාරයකින් හෝ ජනතාවට සිට මතය ප්‍රකාශ කිරීමේ නිදහස මේ රජය විසින් ලබා දී ඇති බවත් මොන කාල සීමාව තුළද මේ රටට සේවයක් සිදු වූයේ යන්න පිළිබඳව රටේ ජනතාව හොඳින් අවබෝධ කරගෙන සිටින බව පවසා සිටියේය. කොරෝනා මර්ධන කාර්යයේදී මේ රජය විසින් සිදු කරන ලද සේවය සුළුකොට තැකිය නොහැකි බවත්  එන්නත් කරණය සම්පූර්ණයෙන්ම අවසන් කර රටේ ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා මේ රජය සුවිශාල සේවයක් සිදු කළ බව පෙන්වා දෙන ලදී. අසල්වැසි ඉන්දියාවේ මෘත දේහ ආදාහනය කර ගැනීමට නොහැකි තරම් රෝගීන් මිය යන අවස්ථාවේදී අපේ රටට ඒ තත්වයට පත් වන්නට නොදී ජංගම රෝහල් පවා සකස් කර ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා කැපවී ක්‍රියා කළ බව සිහිපත් කළ එතුමා රටක් විපතට පත් වන අවස්ථාවක ඒ ආකාරයට ක්‍රියා කිරීම රටේ නායකත්වයේ වැදගත්ම කාර්යක් බවත් ඒ කාර්ය වර්තමාන ජනාධිපතිතුමා විසින් නිසි අයුරින් සිදු කළ බවත් පවසා සිටින ලදී. එම නිසා යම් යම් වකවානු වල රටේ උද්ගත වන තත්වයන් හමුවේ

අවස්ථානුකූලව ක්‍රියා කිරීමට බලයේ සිටින නායකයන්ට සිදු වන බවත් ඒ කරුණු අවබෝධ කරගෙන උද්ගත වන තත්වයන් හමුවේ ප්‍රතිචාර දැක්වීම සිදු කළ යුතු බව අප කවුරුත් අවබෝධ කර ගත යුතු බව පෙන්වා දෙන ලදී.

දිනයට නියමිත කරුණු සාකච්ඡා කර අවසන් බැවින් මහා සභා රැස්වීමේ කටයුතු අවසන් කරන බවත් මීළඟ මහා සභා රැස්වීම 2022 අප්‍රේල් මස 05 වෙනි දින පෙරවරු 09.30 ට ප්‍රාදේශිය සභා කාර්යාලයේදී පැවැත්වෙන බව නිවේදනය කරමින් එදින ප:ව: 12.50 ට පමණ මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපතිතුමා විසින් අවසන් කරන ලදී.

ඒ.ජී.දමිදු ශ්‍යාමින්ද,
සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශිය සභාව.